# ශ්‍රී ලංකා

# ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ

# පාර්ලිමේන්තුව

---

# 1997 අංක 6 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනත

---

**[සහතිකය සටහන් කළේ 1997 ජුනි මස 05 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1997 ජුනි මස 06 වන දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 1, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකිය.

මිල : රු. 19.05 යි. තැපැල් ගාස්තුව : රු. 4.60 යි.

[සහතිකය සටහන් කළේ 1997 ජූනි මස 05 වන දින]

එල්. ඩී.—ඕ. 39/96

**ප්‍රදේශයේ කෘෂිකර්ම, කර්මාන්ත, වෙළෙඳාම, වාණිජ්‍යය සහ වෙනත් සංවර්ධන කටයුතු සංවර්ධනය කිරීම පිණිස විධිවිධාන සැලැස්වීමෙන් ඒ ප්‍රදේශයේ ආර්ථිකය සංවර්ධනය කිරීමේ අරමුණ ඇතිව, නියමිත ප්‍රදේශ සඳහා සංවර්ධන බැංකු පිහිටුවීමට මහ බැංකුවේ මුදල් මණ්ඩලයට හැකි වනු පිණිස ද, ඒ නියමිත ප්‍රදේශවල පිහිටි ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුවල ව්‍යාපාර ඒවාට අනුරූප සංවර්ධන බැංකු වෙත සතු කිරීම පිණිස ද, ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කාරණා සඳහා විධිවිධාන සැලැස්වීම පිණිස ද, වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ :-

1. මේ පනත 1997 අංක 06 දරන ප්‍රාදේශීය සංවර්ධන බැංකු පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

## I වන කොටස

## නියමිත ප්‍රදේශ සඳහා සංවර්ධන බැංකු පිහිටුවීම

2. (1) යම් ප්‍රදේශයක් තුළ, කෘෂිකර්මය, කර්මාන්ත, වෙළෙඳාම, වාණිජ්‍යය සහ වෙනත් සංවර්ධන කටයුතු සංවර්ධනය කිරීම පිණිස විධිවිධාන සැලැස්වීමෙන් ඒ ප්‍රදේශයේ ආර්ථිකය සංවර්ධනය කිරීමේ කාර්යය සඳහා (මෙහි මින් මතු "බැංකුව" යනුවෙන් සඳහන් කරනු ලබන ) සංවර්ධන බැංකුවක් නියමිත ප්‍රදේශයක් සඳහා පිහිටුවීම අවශ්‍ය යයි ( මෙහි මින් මතු "මුදල් මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) මහ බැංකුවේ මුදල් මණ්ඩලයේ නිර්දේශය මත අමාත්‍යවරයා තීරණය කරන අවස්ථාවක දී, ගැසට් පත්‍රයෙහි පළ කරනු ලබන (මෙහි මින් මතු "සංස්ථාගත කිරීමේ නියමය" යනුවෙන් සඳහන් කරනු ලබන ) නියමයක් මගින් මුදල් මණ්ඩලය විසින්- නියමිත ප්‍රදේශයක් සඳහා සංවර්ධන බැංකුවක් පිහිටුවීම සඳහා සංස්ථාගත කිරීමේ නියමය.

(අ) ඒ ප්‍රදේශයේ කෘෂිකර්මය, කර්මාන්ත, වාණිජ්‍යය සහ වෙනත් සංවර්ධන කටයුතු සංවර්ධනය කිරීම පිණිස විධිවිධාන සැලැස්වීමෙන් ඒ ප්‍රදේශයේ ආර්ථිකය සංවර්ධනය කිරීමේ කාර්යය සඳහා (ඇ) ඡේදයෙහි සඳහන් ප්‍රදේශය සඳහා බැංකුවක් පිහිටුවිය යුතු යයි ප්‍රකාශ කරනු ලැබිය යුතු ය;

(ආ) බැංකුවට සංස්ථාගත කිරීමේ නාමයක් දෙනු ලැබිය යුතු ය:

(ඇ) බැංකුව කටයුතු කළ යුතු වන්නේ යම් ප්‍රදේශයක් තුළ ද ඒ ප්‍රදේශය නිශ්චිතව සඳහන් කරනු ලැබිය යුතු ය:

(ඈ) බැංකුවේ ප්‍රධාන ව්‍යාපාර ස්ථානය නිශ්චිතව සඳහන් කරනු ලැබිය යුතු ය ; තවද

(ඉ) බැංකුව විසින් ව්‍යාපාර කටයුතු ආරම්භ කළ යුතු වන්නේ යම් දිනයක ද ඒ දිනය නියම කරනු ලැබිය යුතු ය.

(2) බැංකුව, සංස්ථාගත කිරීමේ නියමය මගින් ඊට දී ඇති නාමයෙන් සංස්ථාවක් විය යුතු අතර, ඊට අවිච්ඡින්න පැවැත්මක් හා පොදු මුද්‍රාවක් තිබිය යුතු ය ; තවද එහි සංස්ථා නාමයෙන් බැංකුව විසින් නඩු පැවරීම ද, බැංකුවට විරුද්ධව නඩු පවරනු ලැබීම ද කරනු ලැබිය හැකි ය.

බැංකුවේ ප්‍රධාන ව්‍යාපාර ස්ථානය, ශාඛා සහ නියෝජ්‍යායතන.

3. (1) බැංකුවේ ප්‍රධාන ව්‍යාපාර ස්ථානය, සංස්ථාගත කිරීමේ නියමයෙහි සඳහන් ස්ථානය විය යුතු ය.

(2) බැංකුවේ ශාඛා හා නියෝජ්‍යායතන පිහිටුවීම අවශ්‍ය යයි බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය සලකන අවස්ථාවක දී, සංස්ථාගත කිරීමේ නියමයෙහි සඳහන් හා බැංකුව කටයුතු කරන්නේ යම් ප්‍රදේශයක් ඇතුළත ද ඒ ප්‍රදේශයේ යම් ස්ථානයක බැංකුව විසින් එසේ ශාඛා හා නියෝජ්‍යායතන පිහිටුවනු ලැබිය හැකි ය.

බැංකුවේ පරමාර්ථය.

4. කෘෂිකර්මය, කර්මාන්ත, වෙළෙඳාම, වාණිජ්‍යය හා ධීවර කටයුතු ද, ඒ ප්‍රදේශයේ සමෘද්ධි ප්‍රතිලාභීන්ගේ ව්‍යාපෘති ද, ඒ ප්‍රදේශයේ පළාත් සභා, ප්‍රාදේශීය සභා සහ වෙනත් යම් පළාත් පාලන ආයතනයක් විසින් භාරගනු ලබන සංවර්ධන ව්‍යාපෘති ද ප්‍රවර්ධනය කිරීම හා සංවර්ධනය කිරීම කෙරෙහි විශේෂ අවධානය ඇතිව, බැංකුව කටයුතු කරන ප්‍රදේශය තුළ සමස්ත ආර්ථික සංවර්ධනයක් ඇති කිරීම සඳහා විධිවිධාන සැලැස්වීම බැංකුවේ පරමාර්ථය විය යුතු ය.

බැංකුවේ බලතල.

5. මේ පනතේ විධිවිධානවලට යටත්ව සහ වෙනත් යම් නීතියකින් හෝ නීතියක් යටතේ බැංකුව වෙත් පවරා ඇති යම් බලතලවලට හානියක් නොමැතිව, බැංකුව විසින් පහත සඳහන් බලතල සියල්ලම හෝ ඉන් කිසිවක් ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය :-

(අ) පුද්ගලයන්ට, සංස්ථාපිත මණ්ඩලවලට හා කණ්ඩායම්වලට කෙටිකාලීන, මධ්‍යකාලීන හා දීර්ඝකාලීන ණය සහ වෙනත් අන්දමේ අනුග්‍රහ ප්‍රදානය කිරීම ;

(ආ) ජංගම ගිණුම් හැර, ස්වකීය ගනුදෙනුකරුවන් සඳහා බැංකු ගිණුම් විවෘත කිරීම, පවත්වාගෙන යාම හා කළමනාකරණය කිරීම ;

(ඇ) විනිමය බිල්පත්‍ර, පොරොන්දු නෝට්ටු, අණකර, කොටස්, සෘණපත්‍ර, සහතිකපත්‍ර, කොටස්පත්‍ර හා වෙනත් සාධන පත්‍ර සහ සුරැකුම්පත් වට්ටම් කිරීම, මිලට ගැනීම, විකිණීම හා ඒවා සම්බන්ධයෙන් කටයුතු කිරීම ;

(ඈ) ණය සහ අත්තිකාරම් සම්බන්ධයෙන් කටයුතු කිරීම ;

(ඉ) ආරක්ෂිත භාරයේ තබා ගැනීම සඳහා සුරැකුම්පත් සහ වටිනා භාණ්ඩ භාර ගැනීම ;

(ඊ) මුදල් සහ සුරැකුම්පත් රැස් කිරීම හා ප්‍රේෂණය කිරීම ;

(උ) නිශ්චල හා චංචල යන දෙවර්ගයේම දේපළ කළමනාකරණය කිරීම සහ 1988 අංක 30 දරන බැංකු පනත යටතේ කරගෙන යාමට බලපත්‍රලාභී වාණිජ බැංකුවලට අවසරය දී ඇති අනුයෝජිත ව්‍යාපාර කටයුතු කරගෙන යාම ;

(ඌ) සුදුසු යයි බැංකුව සලකන යම් ආකාරයකින් මුදල් ණයට ගැනීම, හෝ ලබාගැනීම සහ දැනට ඇත්තා වූ හෝ ඉදිරියේ දී ඇති විය හැකි වූ බැංකුවේ සම්පූර්ණ දේපළ හෝ වත්කම් හෝ ඉන් යම් කොටසක් මත උකසක්, වැය භාරයක් හෝ කැප අයිතියක් මගින්, ණයට ලබා ගන්නා ලද හෝ ලබා ගන්නා ලද හෝ අයවීමට ඇති මුදල් කිසිවක් නොපමාව ආපසු ගෙවීම සුරක්ෂිත කිරීම හා බැංකුව විසින් භාර ගනු ලබන යම් බැඳීමක් හෝ වගකීමක් බැංකුව විසින් ඉටු කිරීම සම්බන්ධයෙන් ඒ හා සමාන උකසක්, වැය භාරයක් හෝ කැප අයිතියක් මගින් සුරක්ෂිත කිරීම සහ සහතික කිරීම ;

(එ) දේපල ඇපයක් වශයෙන් තබාගෙන මුදල් ණයට දීම හා අත්තිකාරම් වශයෙන් දීම සහ ඇප ඇතිව හෝ නොමැතිව

යෝග්‍ය යයි බැංකුව සලකන නියම මත තැනැත්තන්ට, තැනැත්තන් කණ්ඩායම්වලට, ව්‍යාපාර ආයතනවලට හෝ සමාගම්වලට ණය දීම ;

(ඒ) කෘෂිකාර්මික නිෂ්පාදන හෝ වෙනත් යම් නිෂ්පාදිත අලෙවි කිරීමෙහිලා හා සකස් කිරීමෙහි ලා සහාය වීම සහ ප්‍රවර්ධනය කිරීම ;

(ඔ) බදු උකස් ගන්නකුගේ ව්‍යාපාරය පවත්වා ගෙන යාම ;

(ඕ) යම් වංචල හෝ නිශ්චල දේපළ හෝ කෘෂිකාර්මික, කාර්මික, ධීවර, වාණිජ්‍ය හෝ වෙනත් ව්‍යවසාය අත්කර ගැනීම හෝ මිලට ගැනීම සහ එවැනි යම් දේපළක් හෝ ව්‍යවසායක් කළමනාකරණය කිරීම හෝ කළමනාකරණය කිරීම සඳහා කටයුතු යෙදීම සහ ඒ දේපළ හෝ ව්‍යවසාය විකිණීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම ;

(ක) බැංකුවේ පරමාර්ථය සාක්ෂාත් කර ගැනීම පිණිස පෙරටු ව්‍යාපෘති ඇතුළුව සුළු පරිමාණ ව්‍යාපෘති වන්නා වූ ග්‍රාමීය සංවර්ධන ව්‍යාපාර භාර ගැනීම ;

(ග) පරිසර විද්‍යාත්මක වැඩිදියුණු කිරීමේ කොටසක් වශයෙන් ගස් සිටුවීම ආදී කටයුතු දිරිගැන්වීමට සැලැස්වීමෙන් බැංකුව කටයුතු කරන ප්‍රදේශය ප්‍රවර්ධනය කිරීමෙහි හා සංවර්ධනය කිරීමෙහි ලා සහාය වීම සහ ගම් වැඩිදියුණු කිරීම සහ සාමාන්‍යයෙන් බැංකුවේ පරමාර්ථය ඉටු කර ගැනීමෙහිලා උපකාරී වන උපදේශාත්මක සහාය සැලසීම ;

(ච) කෘෂිකාර්මික, කාර්මික, ධීවර, වෙළෙඳ සහ වාණිජ්‍යය කටයුතු සඳහා අවශ්‍ය ගුදම්, බඩු රඳවා තබන ස්ථාන, ගබඩා සහ ගොඩනැගිලි බැංකුව කටයුතු කරන ප්‍රදේශය තුළ ඉදිකිරීම, භාර ගැනීම සහ ඒවා ප්‍රවර්ධනය කිරීම ;

(ජ) යම් බැංකු ආයතනයක් හෝ සමුපකාර සමිතියක් විසින් මුදල් යොදවා ඇති හෝ යම් බැංකු ආයතනයක් හෝ සමුපකාර සමිතියක් විසින් කරගෙන යනු ලබන යම් ව්‍යවසායක් හෝ ව්‍යාපෘතියක් පවරා ගැනීම සඳහා, බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය විසින් සකස් කරන ලද මාර්ගෝපදේශයන්ට යටත්ව, ඒ බැංකු ආයතනය හෝ සමුපකාර සමිතිය සමඟ යම් ගිවිසුමකට ඇතුළත් වීම ;

(ට) මහ බැංකුවෙහි, යම් බලපත්‍රලාභී වාණිජ බැංකුවක හෝ වෙනත් යම් බලපත්‍රලාභී විශේෂිත බැංකුවක හෝ සමුපකාර සමිතියක හෝ මුදල් මණ්ඩලයේ අනුමතය ඇතිව, ශ්‍රී ලංකාවෙන් පිටත යම් බැංකුවක හෝ මූල්‍ය ආයතනයක ගිණුම් විවෘත කිරීම ;

(ඩ) යන්ත්‍ර, උපකරණ සහ වෙනත් භාණ්ඩ සහ බැංකුව කටයුතු කරන ප්‍රදේශය තුළ ගුදම්, බඩු රඳවා තබන ස්ථාන, ගබඩා හා ගොඩනැගිලි බද්දට දීම, කුලියට දීම, සින්නක්කර විකිණීම හෝ කුලී සින්නක්කර පදනමක් මත විකිණීම;

(ණ) යම් නිශ්චල හෝ චංචල දේපළ කවර හෝ ආකාරයකින් අත්කර ගැනීම හා දැරීම, බද්දට හෝ කුලියට ගැනීම හෝ දීම, උකස් කිරීම, ඔඩපනය කිරීම, විකිණීම හෝ අන්‍යාකාරයකින් බැහැර කිරීම;

(ත) බැංකුව කටයුතු කරන ප්‍රදේශය තුළ යටිතල පහසුකම් සංවර්ධනය කිරීමෙහිලා සහභාගි වීම;

(ද) බැංකුව කටයුතු කරන ප්‍රදේශය තුළ වූ සංවර්ධන කටයුතු ප්‍රවර්ධනය කිරීමෙහි හා සංවර්ධනය කිරීමෙහි යෙදී සිටින හෝ ඒ සංවර්ධන කටයුතුවල මුදල් යොදවන වෙනත් ආයතන සමඟ සම්බන්ධකම් පවත්වා ගෙන යාම;

(න) ස්වයං රැකියාවල යෙදී සිටින තැනැත්තන්ට හෝ කෘෂිකර්මාන්තයෙහි, කර්මාන්තයෙහි, වාණිජ්‍යයෙහි හා වෙළෙඳාමෙහි යෙදී සිටින තැනැත්තන්ට උපදේශක සේවා සැලසීම සහ ඒ තැනැත්තන්ගේ නිපුණතා පුහුණු කිරීම භාර ගැනීම;

(ප) කුඩා සහ මධ්‍යම පරිමාණ ව්‍යවසාය සඳහා කාර්මික උද්‍යාන සංවර්ධනය කිරීම හා කළමනාකරණය කිරීම;

(බ) බැංකුවේ කටයුතු කර ගෙන යාම සඳහා අවශ්‍ය නිලධරයන් හා සේවකයන් පත් කිරීම, ඒ නිලධරයන්ගේ හා සේවකයන්ගේ වේතන, වැටුප් හෝ වෙනත් පාරිශ්‍රමික නියම කිරීම සහ ඒ නිලධරයන්ගේ හා සේවකයන්ගේ සේවා නියම හා කොන්දේසි නිශ්චය කිරීම;

(ම) බැංකුව විසින් සේවයෙහි නියුක්ත කරනු ලැබූ නිලධරයන්ට හා සේවකයන්ට සුබසාධන හා විනෝද පහසුකම් සහ ඉඳුම් හිටුම් පහසුකම් සැලැසීම;

(ය) බැංකුවේ බලතල ක්‍රියාත්මක කිරීම හා කාර්ය ඉටු කිරීම සඳහා අවශ්‍ය, ශ්‍රී ලංකාව ඇතුළත හෝ ඉන් පිටත සියලු ගිවිසුම්වලට ඇතුළත්වීම සහ ඒවා ඉටු කිරීම;

(අඅ) බැංකුවේ නිලධරයන් හා සේවකයන් පත් කිරීම, උසස් කිරීම, ඔවුන්ට පාරිශ්‍රමික ගෙවීම, ඔවුන් විෂයයෙහි විනය පාලනය හා ඔවුන්ට නිවාඩු දීම ඇතුළුව, ඒ නිලධරයන් හා සේවකයන් සම්බන්ධයෙන් රීති සෑදීම;

(ආආ) බැංකුවේ කටයුතු පරිපාලනය කිරීම සම්බන්ධයෙන් රීති සෑදීම ; සහ

(ඇඇ) බැංකුවේ ව්‍යාපාරය නිසි ලෙස කරගෙන යාම පහසු කිරීම පිණිස බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ මතය අනුව අවශ්‍ය වෙනත් සියලු දේ කිරීම.

## II වන කොටස
## බැංකුවේ කළමනාකරණය

අධ්‍යක්ෂ මණ්ඩලය.

**6**. (1) බැංකුවේ කටයුතු හා ව්‍යාපාරය කළමනාකරණය සහ පරිපාලනය (මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) අධ්‍යක්ෂ මණ්ඩලයක් වෙත පැවරෙන්නේ ය.

(2) මණ්ඩලය විසින්, මේ පනත යටතේ හෝ වෙනත් යම් නීතියක් යටතේ හෝ බැංකුව සතු සියලු බලතල ක්‍රියාත්මක කළ හැකි අතර, අවස්ථාවෝචිත පරිදි, මේ පනත යටතේ හෝ වෙනත් යම් නීතියක් යටතේ බැංකුව විසින් කිරීමට හා ඉටු කිරීමට බලය දී ඇති සියලු ක්‍රියා හා දේ බැංකුව විසින් කළ හැකි ය.

(3) මණ්ඩලය විසින් එහි බලතල ක්‍රියාත්මක කිරීමේ දී ස්ථාවර ව්‍යාපාරික මූලධර්ම මත පිහිටා ක්‍රියා කළ යුතු අතර, බැංකුව කටයුතු කරන්නේ යම් ප්‍රදේශයක් ඇතුළත ද ඒ ප්‍රදේශය ඇතුළත ආර්ථික සංවර්ධනය කෙරෙහි නිසි සැලකිල්ලක් දක්වනු ලැබිය යුතු ය.

මණ්ඩලයේ සංයුතිය.

**7**. (1) මේ පනතේ 8 වන වගන්තිය හෝ 9 වන වගන්තිය යටතේ, අවස්ථාවෝචිත පරිදි, නම් කරන ලද හෝ තෝරා පත් කරගනු ලැබූ, අධ්‍යක්ෂවරයන් අතුරින්, නම් කරන ලද හා

තෝරා පත් කර ගනු ලැබූ, අධ්‍යක්ෂවරයන් පහකට නොඅඩු සහ දොළහකට නොවැඩි සංඛ්‍යාවකින්, මණ්ඩලය සංයුක්ත විය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන්ව ඇත ද, පළමුවන වාර්ෂික මහා සභා රැස්වීම පවත්වනු ලබන තෙක්, මණ්ඩලය නම් කරන ලද අධ්‍යක්ෂවරයන්ගෙන් පමණක් සංයුක්ත විය යුතු ය.

8. (1) අමාත්‍යවරයා විසින් පහත සඳහන් නිලධරයන් හා තැනැත්තා මණ්ඩලයේ අධ්‍යක්ෂවරයන් වශයෙන් නම් කරනු ලැබිය යුතු ය :– නම් කරන ලද අධ්‍යක්ෂවරයෝ.

(අ) බැංකුවේ නිකුත් කළ කොටස් ප්‍රාග්ධනයෙන් සියයට අටකට නොඅඩු කොටස් ප්‍රමාණයක් මහ බැංකුව විසින් දරනු ලබන අවස්ථාවක, මුදල් මණ්ඩලයේ නිර්දේශය මත මහ බැංකුවේ නිලධරයකු :

එසේ වුව ද 18 වන වගන්තියේ (3) වන උපවගන්තිය යටතේ මහ බැංකුව විසින් එහි දයක මුදල් ගෙවනු ලබන තෙක්, බැංකුවේ නිකුත් කළ කොටස් ප්‍රාග්ධනයෙන් සියයට අටකට වැඩි ප්‍රමාණයක් දරන බැංකුවේ කොටස් හිමියකු ලෙස මහ බැංකුව සලකනු ලැබිය යුතු අතර, මේ ඡේදය යටතේ මණ්ඩලයෙහි මහ බැංකුව වෙනුවෙන් අධ්‍යක්ෂ-වරයකු නම් කරනු ලැබීමට ද මහ බැංකුවට හිමිකම තිබිය යුතු ය ;

(ආ) බැංකුවේ නිකුත් කළ කොටස් ප්‍රාග්ධනයෙන් සියයට අටකට නොඅඩු කොටස් ප්‍රමාණයක් ලංකා බැංකුව විසින් දරනු ලබන අවස්ථාවක, ලංකා බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නිර්දේශය මත ඒ බැංකුවේ නිලධරයකු ;

(ඇ) බැංකුවේ නිකුත් කළ කොටස් ප්‍රාග්ධනයෙන් සියයට අටකට නොඅඩු කොටස් ප්‍රමාණයක් මහජන බැංකුව විසින් දරනු ලබන අවස්ථාවක, මහජන බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නිර්දේශය මත, ඒ බැංකුවේ නිලධරයකු ;

(ඈ) බැංකුවේ නිකුත් කළ කොටස් ප්‍රාග්ධනයෙන් සියයට අටකට නොඅඩු කොටස් ප්‍රමාණයක් ජාතික ඉතිරි කිරීමේ බැංකුව විසින් දරනු ලබන අවස්ථාවක, ජාතික ඉතිරිකිරීමේ බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලයේ නිර්දේශය මත ඒ බැංකුවේ නිලධරයකු;

(ඉ) බැංකුවේ නිකුත් කළ කොටස් ප්‍රාග්ධනයෙන් සියයට අටකට නොඅඩු කොටස් ප්‍රමාණයක් සේවක අර්ථසාධක අරමුදල විසින් දරනු ලබන අවස්ථාවක, සේවක අර්ථසාධක අරමුදල නියෝජනය කිරීම පිණිස, මුදල් මණ්ඩලයේ නිර්දේශය මත, මහ බැංකුවේ නිලධරයකු ; සහ

(ඊ) ව්‍යාපාර, වාණිජ, කෘෂිකර්මය, කර්මාන්ත හෝ මුදල් යන ක්ෂේත්‍රයෙහි විශිෂ්ටත්වයක් ලබා ඇත්තා වූ ද බැංකුව කටයුතු කරන්නේ යම් ප්‍රදේශයක් ඇතුළත ද ඒ ප්‍රදේශය සංවර්ධනය කිරීමෙහි ලා නොවෙනස් උනන්දුවක් දක්වන්නා වූ ද, තැනැත්තකු ;

මේ උපවගන්තිය යටතේ අධ්‍යක්ෂවරයකු ලෙස නම් කරනු ලැබූ තැනැත්තකු මෙහි මින්මතු "නම් කරන ලද අධ්‍යක්ෂවරයකු" යනුවෙන් හඳුන්වනු ලැබේ.

(2) නම් කරන ලද අධ්‍යක්ෂවරයකු අවුරුදු හතරක කාලයක් ධුරය දරිය යුතු යː

එසේ වුව ද (1) වන උපවගන්තියේ සඳහන් යම් ආයතනයක්, සුදුසුකම් ලබන කොටස් ප්‍රතිශතය දැරීම නතර වන අවස්ථාවක, ඒ ආයතනය නියෝජනය කරන අධ්‍යක්ෂවරයා සිය ධුරයෙන් ඉල්ලා අස්විය යුතු අතර, ඒ අධ්‍යක්ෂවරයා අධ්‍යක්ෂ ධුරයෙන් එසේ ඉල්ලා අස්වීම පැහැර හරින අවස්ථාවක, අමාත්‍යවරයා විසින් ඒ අධ්‍යක්ෂවරයා ධුරයෙන් ඉවත් කරනු ලැබිය යුතු ය.

(3) අමාත්‍යවරයා විසින් කිසිම හේතුවක් නොදක්වා නම් කරන ලද අධ්‍යක්ෂවරයකු ධුරයෙන් ඉවත් කරනු ලැබිය හැකි ය.

(4) අමාත්‍යවරයා අමතා යවනු ලබන ලිපියක් මගින් නම් කරන ලද අධ්‍යක්ෂවරයකු විසින් ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(5) රෝගාතුර වීම හෝ වෙනත් අබලතාවක් නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා නම් කරන ලද අධ්‍යක්ෂවරයකුට ස්වකීය ධුරයේ කාර්ය ඉටු කිරීමට තාවකාලිකව නොහැකි වන අවස්ථාවක, අවස්ථාවෝචිත පරිදි, ඒ අධ්‍යක්ෂවරයා නියෝජනය කරන ආයතනයේ අධ්‍යක්ෂ මණ්ඩලය හෝ මුදල් මණ්ඩලය විමසා අමාත්‍යවරයා විසින්, මණ්ඩලයේ රැස්වීම්වල දී ඔහුගේ විකල්ප අධ්‍යක්ෂවරයා වශයෙන් ක්‍රියා කිරීම පිණිස වෙනත් තැනැත්තකු

නම් කරනු ලැබිය හැකි අතර, එසේ නම් කරන ලද තැනැත්තාට ඒ රැස්වීම්වල දී ඡන්දය දීමට අයිතිවාසිකමක් තිබිය යුතු ය.

(6) (2) වන උපවගන්තියේ අතුරු වගන්තිය යටතේ ඉල්ලා අස්වීමෙන් හෝ ඉවත් කරනු ලැබීමෙන් හෝ හැර, නම් කරන ලද අධ්‍යක්ෂවරයකු මියයාමෙන්, ඉල්ලා අස්වීමෙන් හෝ ධුරයෙන් ඉවත් කරනු ලැබීමෙන් ස්වකීය ධුරය හිස් කරන විටක ධුරය හිස් කරන ඒ තැනැත්තා විසින් නියෝජනය කරනු ලැබූ ආයතනය නියෝජනය කිරීම පිණිස, වෙනත් තැනැත්තෙකු (1) වන උපවගන්තියේ විධිවිධානවලට අනුකූලව අමාත්‍යවරයා විසින්, නම් කරනු ලැබිය යුතු ය. එසේ නම් කරනු ලැබූ තැනැත්තා විසින්, ඔහු අනුප්‍රාප්ත වූයේ යම් නම් කරන ලද අධ්‍යක්ෂවරයකු වෙනුවෙන් ද ඒ අධ්‍යක්ෂවරයාගේ ධුර කාලයෙන් ඉකුත් නොවී ඇති කාලය සඳහා ධුරය දැරිය යුතු ය.

තෝරා පත් කර ගනු ලැබූ අධ්‍යක්ෂවරයෝ.

**9**. (1) බැංකුවේ කොටස් හිමියන් විසින් දරනු ලබන බැංකුවේ නිකුත් කරන ලද මුළු කොටස් ප්‍රාග්ධනයෙන් සෑම සියයට අටක් සඳහා එක් සාමාජිකයකු විය යුතුය යන පදනම මත, බැංකුවේ කොටස් හිමියන්ගේ සෑම වාර්ෂික මහා සභා රැස්වීමක ම, (8 වන වගන්තියේ (1) වන උප වගන්තියේ සඳහන් කොටස් හිමියන් හැර) බැංකුවේ කොටස් හිමියන් විසින්, මණ්ඩලයේ තෝරා ගනු ලැබූ අධ්‍යක්ෂවරයන් තෝරා පත් කර ගනු ලැබිය යුතු ය; එසේ වුවද, එසේ තෝරා පත් කර ගනු ලබන අධ්‍යක්ෂවරයන් සංඛ්‍යාව 7 වන වගන්තිය යටතේ සඳහන් කර ඇති මණ්ඩලයේ අධ්‍යක්ෂවරයන්ගේ උපරිම සංඛ්‍යාව සහ 8 වන වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින් නම් කරනු ලැබිය හැකි අධ්‍යක්ෂවරයන්ගේ සංඛ්‍යාව අතර වෙනස, නොඉක්මවිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ මණ්ඩලයේ තෝරා පත්කර ගනු ලැබූ අධ්‍යක්ෂවරයන් තෝරා පත්කර ගැනීමට හිමිකම් ඇති බැංකුවේ කොටස් හිමියන්ගෙන් අටෙන් එකකගේ ඉල්ලීම පිට කැඳවන ලද ඒ කොටස් හිමියන්ගේ රැස්වීමක දී (1) වන උපවගන්තිය යටතේ යම් තෝරා පත් කර ගනු ලැබූ යම් අධ්‍යක්ෂවරයකු තෝරා පත්කර ගැනීමට හිමිකම් ඇති බැංකුවේ කොටස් හිමියන් විසින්, තෝරා පත් කර ගනු ලැබූ අධ්‍යක්ෂවරයකු ඉවත් කොට ඔහු වෙනුවට වෙනත් අධ්‍යක්ෂවරයකු තෝරා පත් කර ගනු ලැබිය හැකි ය.

(3) මණ්ඩලයේ සභාපතිවරයා වෙත තත් කාරණය සම්බන්ධයෙන් අමතා යවනු ලබන ලිපියක් මගින්, තෝරා පත් කර ගනු ලැබූ අධ්‍යක්ෂවරයකුට ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(4) රෝගාතුරවීම හෝ වෙනත් අබලතාවක් නිසා හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා තෝරා පත් කර ගනු ලැබූ අධ්‍යක්ෂවරයකුට ස්වකීය ධුරයේ කාර්ය ඉටු කිරීමට තාවකාලිකව නොහැකි වන අවස්ථාවක, ඒ අධ්‍යක්ෂවරයා විසින් මණ්ඩලයේ එකඟත්වය ඇතිව, මණ්ඩලයේ රැස්වීම්වල දී ඔහුගේ විකල්ප අධ්‍යක්ෂවරයා වශයෙන් ක්‍රියා කිරීම පිණිස වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි අතර, එසේ පත් කරන ලද තැනැත්තාට ඒ රැස්වීම්වල දී ඡන්දය දීමට අයිතිවාසිකමක් තිබිය යුතු ය.

(5) ධුරයෙන් ඉවත් කරනු ලැබීමෙන්, මියයාමෙන් හෝ ඉල්ලා අස්වීමෙන් තෝරා පත් කර ගනු ලැබූ අධ්‍යක්ෂවරයකු ධුරය හිස් කරන විටක දී හෝ (8 වන වගන්තියේ (1) වන උප වගන්තියෙහි සඳහන් කොටස් හිමියන් නොවන) කොටස් හිමියන්ගේ කොටස් දැරීම වැඩිවීමේ ප්‍රතිඵලයක් වශයෙන් තෝරා පත් කර ගැනීම අවශ්‍ය කෙරෙන තෝරා පත් කර ගනු ලැබූ අධ්‍යක්ෂවරයන්ගේ සංඛ්‍යාව වැඩි වූ විටක දී, මණ්ඩලය විසින්, අවස්ථාවෝචිත පරිදි, ඒ පුරප්පාඩුව පිරවීම පිණිස වෙනත් තැනැත්තකු පත් කරනු ලැබිය හැකි ය.; නැතහොත් මණ්ඩලයට අලුත් සාමාජිකයකු පත් කරනු ලැබිය හැකි ය; තවද එසේ පත් කරනු ලබන තැනැත්තා, ඒ පත් කිරීමෙන් පසුව පැවැත්වීමට නියමිත බැංකුවේ පළමුවන වාර්ෂික මහා සභා රැස්වීම පවත්වනු ලබන තෙක් ධුරය දැරිය යුතු අතර, ඒ රැස්වීමේ දී අධ්‍යක්ෂවරයකු වශයෙන් නැවත තෝරා පත් කර ගනු ලැබීමට ඔහු සුදුසුකම් ලැබිය යුතු ය.

(6) (8 වන වගන්තියේ (1) වන උපවගන්තියේ සඳහන් වන ආයතන හැර) කොටස් හිමියන් විසින් පුරප්පාඩුව හෝ පුරප්පාඩු නොපිරවීමට ප්‍රකාශිතව ම යෝජනා සම්මත කරන්නේ නම් හෝ බැංකුවේ කොටස් හිමියන්ගේ සෑම වාර්ෂික මහා සභා රැස්වීමක දිනයට පෙරාතුව ම වූ දිනයේ දී (8 වන වගන්තියේ (1) වන උපවගන්තියේ සඳහන් වන ආයතන හැර) කොටස් හිමියන් දරන කොටස් ප්‍රමාණය අනුව ඒ පුරප්පාඩුව හෝ පුරප්පාඩු පිරවීම යුක්ති සහගත නොවන්නේ නම් මිස, තෝරා පත් කර ගත් අධ්‍යක්ෂවරයන්ගෙන් තුනෙන් එකක් හෝ තෝරා පත් කර ගත් අධ්‍යක්ෂවරයන්ගේ සංඛ්‍යාව තුනක් හෝ තුනේ ගුණිතයක් නොවේ නම්, එවිට, ඒ සංඛ්‍යාවේ තුනෙන් එකට ආසන්නම සංඛ්‍යාව විසින්, බැංකුවේ කොටස් හිමියන්ගේ සෑම වාර්ෂික මහා සභා රැස්වීමක දී ම ධුරය හිස් කළ යුතු අතර, අවස්ථාවෝචිත පරිදි, ඒ පුරප්පාඩුව හෝ පුරප්පාඩු පිරවීම පිණිස වෙනත් තැනැත්තන් තෝරා පත් කර ගනු ලැබිය යුතු ය.

(7) මේ වගන්තියේ (1) වන, (5) වන හා (6) වන උපවගන්තිවල සඳහන් විධිවිධානවල කුමක් සඳහන්ව ඇත ද, 8 වන වගන්තියේ (1) වන උපවගන්තියේ සඳහන් ආයතන අතුරින් කවර හෝ ආයතනයක් විසින්, ඒ උපවගන්තියේ (අ), (ආ), (ඇ), (ඈ), (ඉ) සහ (ඊ) ඡේදවල ඇතුළත්, මණ්ඩලයෙහි නම් කරන ලද අධ්‍යක්ෂවරයකු සිටීමට ඒ ආයතන හිමිකම් ලබන, ඒ එක් එක් ආයතන සම්බන්ධයෙන් සඳහන් කර ඇති නිකුත් කළ කොටස් ප්‍රාග්ධනයේ සියයට ගණනට අඩු ප්‍රමාණයක් දරන විටක දී, ඒ ආයතන, අවස්ථාවෝචිත පරිදි (1) වන, (5) වන හෝ (6) වන උපවගන්ති යටතේ, ඒ වගන්තිවල සඳහන් කොටස් හිමියන් ද සමඟ, තෝරා පත් කර ගනු ලැබූ අධ්‍යක්ෂවරයකු තෝරා පත් කර ගැනීමට හිමිකම් ලැබිය යුතු ය.

(8) (6) වන උපවගන්තිය යටතේ විශ්‍රාම ගත යුතු වූ, තෝරා පත් කර ගනු ලැබූ අධ්‍යක්ෂවරයා හෝ අධ්‍යක්ෂවරයන්, ඒ උපවගන්තියෙහි සඳහන් වාර්ෂික මහා සභා රැස්වීමේ දිනයේ දී වැඩිම කාලයක් ධුරයෙහි සේවය කර ඇති අධ්‍යක්ෂවරයා හෝ අධ්‍යක්ෂවරයන් විය යුතු නමුත්, ඒ දිනයේ දී එක හා සමාන කාලසීමා සඳහා සේවය කර ඇති තෝරා පත් කර ගනු ලැබූ අධ්‍යක්ෂවරයන් සම්බන්ධයෙන් වන විට, විශ්‍රාම ගත යුතු අධ්‍යක්ෂවරයා කවරකු ද යන වග රැස්වීමේ සභාපතිවරයා විසින් කුසපත් ඇදීමෙන් නිශ්චය කරනු ලැබිය යුතු ය.

(9) විශ්‍රාම ගන්නා, තෝරා පත් කර ගනු ලැබූ අධ්‍යක්ෂවරයකු නැවත තෝරා පත් කර ගනු ලැබීමට සුදුස්සකු විය යුතු ය.

10. (1) බැංකුව සඳහා ස්ථාපනය කරනු ලැබිය යුතු ප්‍රථම අධ්‍යක්ෂ මණ්ඩලය, මේ පනතේ 8 වන වගන්තියෙහි සඳහන් ආකාරයට නම් කරනු ලැබූ, නම් කරන ලද අධ්‍යක්ෂවරයන්ගෙන් සංයුක්ත විය යුතු අතර, ඒ මණ්ඩලය, ඉන් පසුව කවර හෝ අවස්ථාවක පවත්වනු ලබන කොටස්හිමියන්ගේ වාර්ෂික මහා සභා රැස්වීමක දී, 9 වන වගන්තිය යටතේ තෝරා පත් කර ගනු ලැබූ අධ්‍යක්ෂවරයන්, තෝරා පත් කර ගනු ලබන තෙක්, බැංකුවේ අධ්‍යක්ෂ මණ්ඩලය ලෙස දිගට ම කටයුතු කළ යුතු ය. ප්‍රථම අධ්‍යක්ෂ මණ්ඩලය.

(2) මණ්ඩලයේ නම් කරනු ලැබූ අධ්‍යක්ෂවරයකු මිය යාම, ධුරයෙන් ඉල්ලා අස්වීම හෝ ඉවත් කිරීම නිසා ධුරය හිස් කිරීමට සහ තාවකාලික වශයෙන් නොපැමිණීමට අදාළ 8 වන වගන්තියේ විධිවිධාන, ප්‍රථම අධ්‍යක්ෂ මණ්ඩලයේ සමාජිකයන්ට හා ඒ සාමාජිකයන් සම්බන්ධයෙන් අදාළ විය යුතු ය.

මණ්ඩලයේ සභාපතිවරයා.

11. (1) මණ්ඩලය විසින්, මණ්ඩලයේ අධ්‍යක්ෂවරයන් අතරින් එක් අධ්‍යක්ෂවරයකු මණ්ඩලයේ සභාපතිවරයා වශයෙන් තෝරා පත් කර ගනු ලැබිය යුතු ය.

(2) රෝගාතුර වීම, අබලතාවට පත්වීම හෝ ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම නිසා සභාපතිවරයාට ස්වකීය ධුරයේ කාර්ය ඉටු කිරීමට තාවකාලිකව නොහැකි වන අවස්ථාවක, ඔහු වෙනුවෙන් ක්‍රියා කිරීම සඳහා මණ්ඩලය විසින් වෙනත් අධ්‍යක්ෂවරයකු තෝරා පත් කර ගනු ලැබිය යුතු ය.

(3) මණ්ඩලය විසින් මණ්ඩලයේ සභාපතිවරයාගේ පත්වීම, ඒ සඳහා කිසිම හේතුවක් නොදක්වා අවසන් කළ හැකි අතර, ඒ අවසන් කිරීම යම් අධිකරණයක දී ප්‍රශ්න කරනු නොලැබිය යුතු ය.

(4) සභාපතිවරයා විසින්, මණ්ඩලය අමතා යවන ලද ලිපියක් මගින් ස්වකීය ධුරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(5) (2) වන සහ (3) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව, සභාපතිවරයාගේ ධුර කාලය, ඔහු මණ්ඩලයේ සාමාජිකත්වය දරන කාලය විය යුතු ය.

අධ්‍යක්ෂවරයන්ගේ පාරිශ්‍රමික.

12. මේ පනතේ 10 වන වගන්තිය යටතේ ප්‍රථම වාර්ෂික මහා සභා රැස්වීම් පවත්වනු ලබන තෙක්, අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන යම් පාරිශ්‍රමිකයක් බැංකුවේ අරමුදලින් අධ්‍යක්ෂවරයන්ට ගෙවනු ලැබිය හැකි ය. ඉන් අනතුරුව අධ්‍යක්ෂවරයන්ට ගෙවිය යුතු පාරිශ්‍රමිකය, බැංකුවේ කොටස්හිමියන් විසින් සෑම වාර්ෂික මහා සභා රැස්වීමක දී ම නිශ්චය කරනු ලබන පරිදි විය යුතු ය.

බැංකුව විසින් ඇතුළත් වීමට යෝජිත ගිවිසුම් විෂයයෙහි ඇති සම්බන්ධතා අධ්‍යක්ෂවරයා විසින් හෙළිදරව් කළ යුතු බව.

13. බැංකුව විසින් ඇතුළත් වීමට යෝජිත ගිවිසුමක් විෂයයෙහි කෙළින්ම හෝ නොඑසේව සම්බන්ධතාවක් ඇති අධ්‍යක්ෂවරයකු විසින් ඒ සම්බන්ධතාවේ ස්වභාවය මණ්ඩලයේ රැස්වීමක හෙළිදරව් කරනු ලැබිය යුතු ය. ඒ හෙළිදරව් කිරීම මණ්ඩලයේ රැස්වීම් වාර්තාවල වාර්තාගත කළ යුතු අතර, ඒ ගිවිසුම හා සම්බන්ධ ඒ මණ්ඩලයේ කිසිම සාකච්ඡාවකට හෝ තීරණයකට ඒ අධ්‍යක්ෂවරයා සහභාගි නොවිය යුතු ය.

මණ්ඩලයේ රැස්වීම්, ගණ පූරණය සහ කාර්ය පටිපාටිය විධිමත් කර ගැනීම.

14. (1) මණ්ඩලයේ සභාපතිවරයා පැමිණ සිටින මණ්ඩලයේ සෑම රැස්වීමක ම මූලාසනය සභාපතිවරයා විසින් දැරිය යුතු ය. එවැනි යම් රැස්වීමකට සභාපතිවරයා පැමිණ නොමැති විටක, පැමිණ සිටින අධ්‍යක්ෂවරයන් විසින් ඔවුන් අතුරින් අධ්‍යක්ෂවරයකු ඒ රැස්වීමේ මූලාසනය දැරීම සඳහා තෝරා පත් කර ගනු ලැබිය යුතු ය.

(2) මණ්ඩලයේ කවර හෝ රැස්වීමක ගණපූරණය, අධ්‍යක්ෂවරයන්ගේ (තෝරා පත් කර ගනු ලැබූ සහ නම් කරන ලද අධ්‍යක්ෂවරයන් යන දෙවර්ගයේ ම) මුළු ගණන අටදෙනකු හෝ ඊට අඩුවන අවස්ථාවක, අධ්‍යක්ෂවරයන් තිදෙනකු විය යුතු අතර, අධ්‍යක්ෂවරයන්ගේ එකී මුළු ගණන අට දෙනකුට වැඩිවන අවස්ථාවක, අධ්‍යක්ෂවරයන් පස් දෙනකු විය යුතු ය.

(3) මණ්ඩලයේ යම් රැස්වීමක මූලාසනය දරන තැනැත්තාට ඔහුගේ ඡන්දයට අතිරේකව තීරක ඡන්දයක් ද තිබිය යුතු ය.

(4) (2) වන සහ (3) වන උපවගන්තිවල විධිවිධානවලට යටත්ව, මණ්ඩලය විසින්, මණ්ඩලයේ රැස්වීම් සම්බන්ධයෙන් හා ඒ රැස්වීම්වල කටයුතු කිරීම සම්බන්ධයෙන් එහි කාර්ය පටිපාටිය විධිමත් කර ගනු ලැබිය හැකි ය.

**15.** අධ්‍යක්ෂවරයන් අතර යම් පුරප්පාඩුවක් තිබීමේ හෝ අධ්‍යක්ෂවරයකු පත් කිරීමෙහි හෝ තෝරා පත් කිරීමෙහි ලා යම් දෝෂයක් තිබීමේ හේතුව නිසාම පමණක්, මණ්ඩලයේ යම් ක්‍රියාවක් හෝ කටයුත්තක් අවලංගු නොවිය යුතු ය. යම් පුරප්පාඩුවක් තිබීමේ හේතුවෙන් මණ්ඩලයේ ක්‍රියා අවලංගු නොවිය යුතුය.

**16.** (1) මණ්ඩලය විසින්, එහි බලතල හා කාර්ය කිසිවක් බැංකුවේ සමාන්‍යාධිකාරීවරයා හෝ වෙනත් යම් නිලධරයකු හෝ සේවකයකු වෙත කලින් කල පවරනු ලැබිය හැකි ය. මණ්ඩලයේ බලතල හා කාර්ය පැවරීම.

(2) (1) වන උපවගන්තිය යටතේ යම් බලයක් හෝ කාර්යයක් පවරන ලද්දේ යම් තැනැත්තකු වෙත ද ඒ සෑම තැනැත්තකු විසින් ම, තමා වෙත පවරන ලද ඒ බලය හෝ කාර්යය, මණ්ඩලය විසින් නියම්තව සඳහන් කරනු ලැබිය හැකි යම් නියම හා කොන්දේසිවලට යටත්ව, ක්‍රියාත්මක කරනු ලැබිය හැකිය ; නැතහොත් ඉටු කරනු ලැබිය හැකි ය. තව ද, එසේ පවරන ලද බලය හා කාර්යය මණ්ඩලය විසින් ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබිය හැකි ය.; නැතහොත් ඉල්ලා අස්කර ගත හැකි ය.

**17.** (1) බැංකුවේ මුද්‍රාව සභාපතිවරයාගේ හෝ ඔහු විසින් බලය දෙන ලද වෙනත් යම් නිලධරයකුගේ හෝ භාරයේ තිබිය යුතු ය. බැංකුවේ මුද්‍රාව.

(2) මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් ආකාරයකට බැංකුවේ මුද්‍රාව වෙනස් කරනු ලැබිය හැකි ය.

(3) බැංකුවේ මුද්‍රාව මණ්ඩලයේ අධ්‍යක්ෂවරයන් දෙදෙනකු හෝ මණ්ඩලයේ එක් අධ්‍යක්ෂවරයකු හෝ සාමාන්‍යාධිකාරීවරයා ඉදිරිපිට දී හැර කවර හෝ සාධන පත්‍රයකට තබනු නොලැබිය යුතු අතර, තමන් පැමිණි බවට සලකුණක් වශයෙන් ඔවුන් දෙදෙනාම ඒ සාධන පත්‍රයට අත්සන් තබනු ලැබිය යුතු ය.

## III වන කොටස

## මුදල්

බලයලත් ප්‍රාග්ධනය සහ ආරම්භක ප්‍රාග්ධනයට දෙනු ලබන දායක මුදල්.

18. (1) බැංකුවේ බලයලත් කොටස් ප්‍රාග්ධනය එකක් රුපියල් දහය බැගින් වූ කොටස් මිලියන පනහකට බෙදනු ලැබූ රුපියල් මිලියන පන්සියයක් විය යුතු ය.

(2) පහත දැක්වෙන එක් එක් ආයතනය, එනම්—

(අ) ලංකා බැංකුව ;
(ආ) මහජන බැංකුව ;
(ඇ) ජාතික ඉතිරි කිරීමේ බැංකුව ; සහ
(ඈ) සේවක අර්ථසාධක අරමුදල

විසින්, බැංකුව පිහිටුවීමට අදාළ සංස්ථාගත කිරීමේ නියමය පළ කිරීමේ දින සිට සති දෙකක් පසු නොවී රුපියල් මිලියන දොළහකට නොවැඩි මුදලක් වන්නා වූ, අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලැබිය හැකි මුදල් ප්‍රමාණයක දායක මුදලක්, ඒ බැංකුවේ ආරම්භක ප්‍රාග්ධනයට දෙනු ලැබිය යුතු ය. ඒ දායක මුදල් ප්‍රකාර, ඒ ආයතනය බැංකුවේ කොටස් හිමියකු බවට පත්විය යුතු අතර, එහි දායක මුදලේ ප්‍රමාණයට සමානුපාතිකව බැංකුවේ කොටස් ඊට වෙන් කරනු ලැබිය යුතු ය.

(3) මේ පනතේ 47 වන වගන්තිය යටතේ පැවරීමේ බැංකුවේ හෝ බැංකුවල ශුද්ධ වටිනාකම මුදල් මණ්ඩලය විසින් නිසැකව දැන ගැනීමෙන් පසුව ඒ ශුද්ධ වටිනාකම කෙරෙහි සැලකිල්ලක් දක්වමින් අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව මුදල් මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් මුදල් ප්‍රමාණයක දායක මුදලක්, මහ බැංකුව විසින් බැංකුවේ ආරම්භක ප්‍රාග්ධනයට දෙනු ලැබිය යුතු ය, තව ද—

(අ) බැංකුවක් සම්බන්ධයෙන් එසේ නිශ්චිත දායක මුදල් ඒ පැවරීමේ බැංකුවේ හෝ බැංකුවල ශුද්ධ වටිනාකමට සමාන වන්නා වූ හෝ අඩුවන්නා වූ අවස්ථාවක, එසේ නිශ්චය කළ මුදලේ වටිනාකම දක්වා වූ ශුද්ධ වටිනාකම මහ බැංකුව විසින් ඒ බැංකුවේ ආරම්භක ප්‍රාග්ධනයට දෙනු ලැබූ දායක මුදල් ලෙස සලකනු ලැබිය යුතු අතර ඒ ශුද්ධ වටිනාකම හා දෙන ලදැයි සලකන ලද දායක

මුදල් අතර වෙනස පිළිබඳව 48 වන වගන්තියේ විධිවිධාන සලස්වනු ලැබ ඇති ආකාරයට කටයුතු කරනු ලැබිය යුතු ය ;

(ආ) බැංකුවක් සම්බන්ධයෙන් එසේ නිශ්චිත දායක මුදල් ඒ පැවරීමේ බැංකුවේ හෝ බැංකුවල ශුද්ධ වටිනාකමට වඩා වැඩි වූ අවස්ථාවක ඒ ශුද්ධ වටිනාකම ඒ බැංකුවේ ආරම්භක ප්‍රාග්ධනයට දෙනු ලැබූ මහ බැංකුවේ දායක මුදලේ කොටසක් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ ශුද්ධ වටිනාකම සහ ඒ බැංකුවේ ආරම්භක ප්‍රාග්ධනයට මහ බැංකුව විසින් දෙනු ලැබිය යුතු යයි සැලකෙන දායක මුදල් අතර වෙනසට සමාන වූ වැඩිමනත් මුදලක් මහ බැංකුව විසින් ඒ බැංකුවට දෙනු ලැබිය යුතු ය.

(4) (3) වන උපවගන්තිය යටතේ දෙන ලද දායක මුදල් ප්‍රකාර, මහ බැංකුව, බැංකුවේ කොටස් හිමියකු බවට පත්විය යුතු අතර, එය විසින් දෙන ලද දායක මුදල් ප්‍රමාණයට සමානුපාතිකව ඊට කොටස් වෙන්කර දෙනු ලැබිය යුතු ය.

(5) (3) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුව ද, ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුවක් පිහිටුවා නොමැති නිශ්චිත ප්‍රදේශයක් සඳහා මේ පනත යටතේ බැංකුවක් පිහිටුවනු ලැබූ අවස්ථාවක, ඒ බැංකුව පිහිටුවනු ලැබූ දින සිට සති දෙකකට නොඅඩු කාලයක් තුළ ඒ බැංකුවේ ප්‍රාග්ධනයට, අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව මුදල් මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන මුදලක් මහ බැංකුව විසින් දෙනු ලැබිය යුතු ය. තව ද එසේ එමගින් ඒ බැංකුවේ කොටස් හිමියකු බවට පත්විය යුතු අතර, එහි දායක මුදලේ ප්‍රමාණයට සමානුපාතිකව ඒ බැංකුවේ කොටස් එයට වෙන්කර දෙනු ලැබිය යුතු ය.

(6) (2) වන උපවගන්තියේ සඳහන් කොටස් හිමියන් විසින්, ස්වකීය අභිමතය පරිදි, ඒ බැංකුවේ ආරම්භක ප්‍රාග්ධනයට ඒ කොටස් හිමියන් විසින් දෙනු ලැබිය යුතු දායක මුදල් වශයෙන් අමාත්‍යවරයා විසින් නිශ්චය කරනු ලබන මුදලට අතිරික්තව වැඩිමනත් ප්‍රාග්ධනයක් දීම හෝ බැංකුවේ කොටස් මිල දී ගැනීම කරනු ලැබිය හැකි ය.

බැංකුව විසින් අනායත්ත කොටස් පිරිනැමීම.

**19**. (1) 18 වන වගන්තියේ (2) වන උපවගන්තිය යටතේ වෙන්කර දෙනු නොලැබුවා වූ ද ඒ වගන්තියේ (1) වන උපවගන්තියෙහි සඳහන් වූ ද යම් තාක් වූ කොටස්, මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් වේලාවක හෝ වේලාවක් තුළ දී යම් මුදලකින් හෝ මුදල්වලින් යම් ආකාරයකට යම් බලපත්‍රලාභි

වාණිජ බැංකුව ට බලපත්‍රලාභි විශේෂිත බැංකුවකට හෝ වෙනත් යම් තැනැත්තකුට හෝ මණ්ඩලයේම මෙහෙයීමෙන් හෝ මුදල් මණ්ඩලයේ නිර්දේශ මත මණ්ඩලය විසින් පිරිනමනු ලැබිය හැකි ය.

(2) යම් බලපත්‍රලාභි වාණිජ බැංකුවක් විසින් බැංකුවේ කොටස් කිසිවක් අත්කරගනු ලබන අවස්ථාවක ඒ බලපත්‍රලාභි වාණිජ බැංකු විසින් ඒ කොටස් අත්කර ගැනීම හා දැරීම සම්බන්ධයෙන් 1988 අංක 30 දරන බැංකු පනතේ 17අ වගන්තියේ විධිවිධාන අදාළ නොවිය යුතු ය.

බැංකුවේ කොටස් හිමියන් විසින් කොටස් පැවරීම.

**20**. 18 වන වගන්තිය යටතේ බැංකුවේ ආරම්භක ප්‍රාග්ධනයට දායක මුදල් දුන් කොටස් හිමියන් ද ඇතුළු බැංකුවේ කොටස් හිමියන්ට තම කොටස් වෙනත් යම් තැනැත්තකු වෙත පැවරීමේ බලය ඇත්තේ ය.

ආණ්ඩුවෙන් ලබාගන්නා ණය මුදල්.

**21**. බැංකුව විසින් කලින් කල ආණ්ඩුවෙන් ණය ලබා ගත හැකි අතර, ආණ්ඩුව විසින් නිශ්චය කරනු ලැබිය හැකි යම් නියමයන්ට හා කොන්දේසිවලට යටත්ව, පාර්ලිමේන්තුව විසින් අනුමත කරන ලද යම් මුදල් ප්‍රමාණයක්, ඒකාබද්ධ අරමුදලින් මහ බැංකුව මගින් බැංකුව වෙත ණයට දෙනු ලැබිය හැකි ය.

විදේශ ආණ්ඩු ආදියෙන් ණයට ලබා ගැනීම.

**22**. බැංකුව විසින් කලින් කල, අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව මුදල් මණ්ඩලය විසින් දෙන ලද ලිඛිත පූර්ව අනුමතය ඇතිව යම් විදේශ ආණ්ඩුවකින් හෝ ශ්‍රී ලංකාවෙන් පිටත කවර වූ හෝ වෙනත් යම් ප්‍රභවයකින් යම් මුදල් ප්‍රමාණයක් ඒ මත අය කරනු ලබන පොලිය හා එය නැවත ගෙවීම පිළිබඳව මුදල් මණ්ඩලය විසින්, අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව අනුමත කරනු ලැබිය හැකි යම් නියම හා කොන්දේසි මත, ණයට ගනු ලැබිය හැකි ය.

පොදු සංචිත අරමුදල.

**23**. බැංකුව විසින් පොදු සංචිත අරමුදලක් පිහිටුවනු ලැබිය යුතු අතර, එහි වාර්ෂික ලාභවලින් මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන ප්‍රතිශතයක් සෑම වර්ෂයක ම ඒ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

විශේෂ සංචිත අරමුදල.

**24**. බැංකුව විසින්, බොල් හා සැක සහිත ණය සඳහා විශේෂ සංචිත අරමුදලක් පිහිටුවනු ලැබිය යුතු අතර, එහි වාර්ෂික ලාභවලින්, මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන ප්‍රතිශතයක් සෑම වර්ෂයකම ඒ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය.

**25**. (1) " සංවර්ධන අරමුදල" යනුවෙන් හඳුන්වනු ලබන අරමුදලක් බැංකුව විසින් පිහිටුවා පවත්වාගෙන යනු ලැබිය යුතු අතර, සෑම වර්ෂයකම එහි වාර්ෂික ලාභවලින්, මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන ප්‍රතිශතයක් සහ දේශීය හෝ විදේශීය ප්‍රභවයන්ගෙන් ප්‍රදාන හෝ පරිත්‍යාග වශයෙන් බැංකුවට ලැබෙන මුදල් කිසිවක් ඒ අරමුදලට බැර කරනු ලැබිය යුතු ය. සංවර්ධන අරමුදල.

(2) සංවර්ධන අරමුදලේ බැරට ඇති මුදල්—

(අ) දීර්ඝ කාලීන වශයෙන් වර්ධන ශක්තිය ඇති අවදානම වැඩි ව්‍යවසායවලට මුදල් අනුග්‍රහ දීමට සහ ඒවායේ කොටස් ස්කන්ධ මිල දී ගැනීම සඳහා ;

(ආ) බැංකුවේ කටයුතුවලට අදාළ තාක්ෂණික හා වෙනත් විශේෂඥතා ඒවා බැංකුවේ ගනුදෙනුකරුවන්ට ලබාදීමේ අදහසින් අත්කර ගැනීම සඳහා

යෙදවිය හැකි ය.

(3) (2) වන උපවගන්තියේ විධිවිධානවල කුමක් සඳහන් වුවද, යම් දේශීය හෝ විදේශීය ප්‍රභවයකින් ලැබුණු යම් ප්‍රදානයකින් හෝ පරිත්‍යාගයකින් සමන්විත වූ ද (1) වන උපවගන්තිය යටතේ අරමුදලට බැර කරනු ලැබ ඇත්තා වූ ද මුදල්, ඒ ප්‍රදානය හෝ පරිත්‍යාගය කරන ලද්දේ යම් නියමයන්ට හා කොන්දේසිවලට යටත්ව ද ඒ නියමයන්ට හා කොන්දේසිවලට අනුකූලව පමණක් යොදාගත යුතු ය.

(4) (2) වන උපවගන්තියේ සඳහන් කාර්ය අතුරෙන් යම් කාර්යයක් සඳහා වහාම අවශ්‍ය නොවන්නා වූ ද සංවර්ධන අරමුදලේ බැරට ඇත්තා වූ ද මුදල් කිසිවක් මණ්ඩලය විසින් ආයෝජනය කරනු ලැබිය හැකි ය.

**26**. බැංකුවේ වාර්ෂික ලාභවලින් මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන ප්‍රතිශතය කොටස් හිමියන්ට ලාභාංශ ගෙවීමේ කාර්යය සඳහා බැංකුව විසින් යොදවනු ලැබිය යුතු ය. ලාභාංශ ගෙවීම.

**27**. බැංකුව, එහි ව්‍යාපාරික කටයුතු ආරම්භ වූ දිනයේ සිට අවුරුදු දෙකක කාලයක් එහි ලාභ හා ආදායම් මත වූ ආදායම් බද්ද ගෙවීමෙන් නිදහස් කරනු ලැබිය යුතු ය. බැංකුව ආදායම් බද්දෙන් නිදහස් කිරීම.

බැංකුව විසින් ණය දෙනු ලැබිය හැක්කේ කවර ඇපයක් මත ද යන බව.

**28.** (1) බැංකුව විසින් දෙනු ලබන යම් ණයක්, මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන ඇප සහ වෙනත් නියම හා කොන්දේසි මත දෙනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ කුමක් සඳහන්ව තිබුණ ද, මණ්ඩලය විසින් ලිඛිතව සටහන් කරනු ලබන හේතු පදනම් කරගෙන, ඇප අනවශ්‍ය යයි මණ්ඩලය විසින් තීරණය කරනු ලබන අවස්ථාවල දී මණ්ඩලය විසින්, ස්වකීය අභිමතය පරිදි ඇප නොමැතිව ණය දෙනු ලැබිය හැකි ය.

## IV වන කොටස

## කාර්ය මණ්ඩලය

සාමාන්‍යාධිකාරී.

**29.** (1) බැංකු කටයුතු හෝ මූල්‍ය කටයුතු පිළිබඳ පෘථුල පළපුරුද්දක් ඇත්තා වූ සහ —

(අ) පිළිගත් විශ්ව විද්‍යාලයකින් ලබාගත් උපාධියක් ඇත්තා වූ; හෝ

(ආ) ගණකාධිකරණය, බැංකු කටයුතු හෝ වෙනත් අදාළ ක්ෂේත්‍රයක පූර්ණ වෘත්තීය සුදුසුකම් ඇත්තා වූ

තැනැත්තකු මණ්ඩලය විසින් නිශ්චය කරනු ලැබිය යුතු සේවා නියම හා කොන්දේසි මත, බැංකුවේ සාමාන්‍යාධිකාරී ලෙස මණ්ඩලය විසින් පත් කරනු ලැබිය හැකි ය.

(2) සාමාන්‍යාධිකාරී බැංකුවේ ප්‍රධාන විධායක නිලධරයා විය යුතු අතර, මණ්ඩලයේ සාමාන්‍ය විධානය, අධීක්ෂණය හා පාලනයට යටත්ව, බැංකුවේ කටයුතු පවත්වාගෙන යාම, කළමනාකරණය හා පරිපාලනය කරනු ලැබිය යුතු ය. තවද, බැංකුවේ පරමාර්ථ ඉටුකර ගැනීම සඳහා ඊට සහාය විය යුතු ය.

බැංකුවේ කාර්ය මණ්ඩලය.

**30.** (1) මණ්ඩලය විසින්, ස්වකීය කර්තව්‍ය කාර්යක්ෂම ලෙස ඉටුකිරීමේ කාර්යය සඳහා අවශ්‍ය යයි සලකනු ලබන වෙනත් නිලධරයන් හා සේවකයන් පත් කරනු ලැබිය හැකි ය.

(2) (1) වන උපවගන්තිය යටතේ පත් කරන ලද නිලධරයන්ට හා සේවකයන්ට මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන ආකාරයකට සහ අනුප්‍රමාණ අනුව පාරිශ්‍රමික ගෙවනු ලැබිය යුතු අතර, මණ්ඩලය විසින් නිශ්චය කරනු ලබන නියමයන්ට හා සේවා කොන්දේසිවලට ඔවුන් යටත් විය යුතු ය.

## V වන කොටස

## බැංකුවේ ගිණුම් විගණනය

**31**. (1) බැංකුවේ මුදල් වර්ෂය ලිත් වර්ෂය විය යුතු ය. මුදල් වර්ෂය සහ වාර්ෂික මහා සභා රැස්වීම.

(2) බැංකුවේ කොටස් හිමියන්ගේ වාර්ෂික මහා සභා රැස්වීම එක් එක් මුදල් වර්ෂය අවසානයේ සිට මාස හයක් පසු නොවී පවත්වනු ලැබිය යුතු ය.

**32**. (1) බැංකුවේ ආදායම හා වියදම, වත්කම් හා බැරකම් සහ වෙනත් සියලු මුදල් ගනුදෙනු පිළිබඳ නිසි ගිණුම් පොත් තැබීමට, මණ්ඩලය විසින් කටයුතු සැලැස්විය යුතු ය. මණ්ඩලය විසින් නිසි ගිණුම් පොත් තැබීම සහ ශේෂ පත්‍රය හා ලාභාලාභ ගිණුම පිළියෙල කිරීම කළ යුතු බව.

(2) බැංකුවේ එක් එක් මුදල් වර්ෂය ඉකුත් වීමෙන් එක් මසක් ඇතුළත ඒ මුදල් වර්ෂය සම්බන්ධයෙන් බැංකුව විසින් —

(අ) වැඩ කරන අන්තිම දිනට ශේෂ පත්‍රයක්;

(ආ) ලාභාලාභ ගිණුමක්;

පිළියෙල කරනු ලැබිය යුතු ය.

**33**. (1) බැංකුවේ එක් එක් වාර්ෂික මහා සභා රැස්වීමේ දී, බැංකුවේ කොටස් හිමියන් විසින්, බැංකුවේ විගණකවරයා වශයෙන් සුදුසුකම්ලත් විගණකවරයකු පත් කරනු ලැබිය යුතු අතර, ඔහු විසින් ඒ රැස්වීම අවසානයේ සිට ඊළඟ වාර්ෂික මහා සභා රැස්වීම අවසානය දක්වා ධුරය දැරිය යුතු ය : සුදුසුකම්ලත් විගණකවරයකු පත්කිරීම.

එසේ වුවද, 10 වන වගන්තියේ සඳහන් බැංකුවේ ප්‍රථම අධ්‍යක්ෂ මණ්ඩලය විසින්, ඔවුන්ගේ ප්‍රථම රැස්වීමේ දී, බැංකුවේ කොටස්

හිමියන්ගේ ප්‍රථම වාර්ෂික මහා සභා රැස්වීම ඉන්පසුව පවත්වනු ලබන තුරු බැංකුවේ විගණකවරයා වශයෙන් ධුරය දැරීම සඳහා සුදුසුකම්ලත් විගණකවරයකු පත්කරනු ලැබිය යුතු ය.

(2) මේ වගන්තියේ කාර්යය සඳහා "සුදුසුකම්ලත් විගණකවරයා" යන්නෙන් යම් ගණකාධිකාරී සමාගමක එක් එක් නේවාසික හවුල්කරු ශ්‍රී ලංකා වරලත් ගණකාධිකාරීන්ගේ ආයතනයේ හෝ නීතියෙන් පිහිටුවන ලද වෙනත් යම් ආයතනයක හෝ සාමාජිකයකුව සිටින්නේ ද එමෙන්ම ගණකාධිකාරිවරයකු වශයෙන් වෘත්තියේ යෙදීම සඳහා එකී ආයතනයේ සභාව විසින් නිකුත් කරන ලද සහතිකයක් දරන්නේ ද එවැනි වරලත් ගණකාධිකාරී සමාගමක් අදහස් වේ.

විගණකවරයාගේ කාර්ය හා කර්තව්‍ය.

**34**. (1) විගණකවරයා විසින්, බැංකුවේ ගිණුම්, මුදල් සහ මුදල් කළමනාකරණය පරීක්ෂා කරනු ලැබිය යුතු අතර, අවශ්‍ය වූ විටක—

(අ) බැංකුවේ මුදල් කටයුතු පවත්වාගෙන යාම, මේ පනතේ විධිවිධානවලට සහ මේ පනත යටතේ සාදන ලද එයට අදාළ රීති කිසිවකට අනුකූලව, කර ඇත්තේ ද යන බව;

(ආ) මණ්ඩලය විසින් ගිණුම් පවත්වාගෙන යාම සතුටුදායක ලෙස කෙරේ ද යන බව; සහ

(ඇ) (මණ්ඩලය විසින් පිළියෙල කරන ලද ශේෂ පත්‍රය සහ ලාභාලාභ ගිණුම ඇතුළුව) විගණනය කරන ලද ගිණුම් ගිණුම්ගත කිරීමේ, මුදල් යෙදවීමේ හා තක්සේරු කිරීමේ මූලධර්මවලට නිසි සැලකිල්ලක් දක්වමින්, සමාලෝචනයට භාජනය වන කාලය සම්බන්ධයෙන් බැංකුවේ කටයුතු පිළිබඳ සත්‍ය හා සාධාරණ චිත්‍රයක් ඉදිරිපත් කෙරෙන පරිදි සැලසුම් කර ඇද්ද යන බව ද,

පරීක්ෂණයට ලක් කරනු ලැබිය යුතු ය.

(2) තමා විසින් පරීක්ෂා කරන ලද ගිණුම් සහ මණ්ඩලය විසින් පිළියෙල කරන ලද ශේෂ පත්‍රය සහ ලාභාලාභ ගිණුම පිළිබඳ වාර්තාවක් විගණකවරයා විසින් ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

(3) විගණකවරයාගේ වාර්තාව, බැංකුවේ වාර්ෂික මහා සභා රැස්වීමේ දී එහි කොටස් හිමියන් ඉදිරියේ තැබිය යුතු අතර, කවර වූ හෝ කොටස් හිමියකු විසින් පරීක්ෂා කරනු ලැබීම සඳහා එය විවෘතව තැබිය යුතු ය.

**35.** (1) බැංකුවේ සෑම මහා සභා රැස්වීමක් අවසානයේ දී ම, ඒ රැස්වීමේ දී කොටස් හිමියන් විසින් සලකා බලන ලද පහත දැක්වෙන එක් එක් ලේඛනයේ පිටපතක්, මණ්ඩලය විසින්, අමාත්‍යවරයා වෙත යැවීමට සලස්වනු ලැබිය යුතු ය:— පාර්ලිමේන්තුව ඉදිරියේ තැබීම සඳහා අමාත්‍යවරයා වෙත යවනු ලබන ලේඛන.

(අ) ශේෂ පත්‍රය;

(ආ) ලාභාලාභ ගිණුම;

(ඇ) විගණක වාර්තාව; සහ

(ඈ) ගිණුම් පිළියෙල කරන ලද්දේ යම් මුදල් වර්ෂයක් සම්බන්ධයෙන් ද ඒ මුදල් වර්ෂය තුළ දී බැංකුවේ කටයුතු පිළිබඳ විස්තරයක් දැක්වෙන මණ්ඩලයේ සභාපතිගේ වාර්තාවක්.

(2) බැංකුවේ නිකුත් කළ ප්‍රාග්ධනයේ සියයට පණහකට නොඅඩු ප්‍රමාණයක් ආණ්ඩුවට හෝ යම් රාජ්‍ය සංස්ථාවකට අයත්ව ඇති අවස්ථාවක, (1) වන උපවගන්තිය යටතේ තමා වෙත එවන ලද ලේඛනවල පිටපත් අමාත්‍යවරයා විසින් පාර්ලිමේන්තුව ඉදිරියේ තැබීමට සැලැස්විය යුතු ය.

**36.** ශේෂ පත්‍රයේ සහ ලාභාලාභ ගිණුමේ දැක්විය යුතු කරුණු, මණ්ඩලය විසින් ගිණුම් පොත් පවත්වාගෙන යා යුතු ආකාරය, විගණකවරයන්ගේ පාරිශ්‍රමික සහ බැංකුවේ ගිණුම් විගණනයට අදාළ වෙනත් සියලු කරුණු සම්බන්ධයෙන් විධිවිධාන සැලැස්වීම සඳහා මණ්ඩලය විසින් රීති සාදනු ලැබිය හැකි ය. ගිණුම් පවත්වාගෙන යාම සම්බන්ධයෙන් රීති සෑදිය යුතු බව.

## VI වන කොටස

## සාමාන්‍ය විධිවිධාන

**37.** පහත දැක්වෙන ලිඛිත නීතිවල විධිවිධාන බැංකුවට අදාළ නොවිය යුතු ය :- ඇතැම් ලිඛිත නීති බැංකුවට අදාළ නොවිය යුතු බව.

(අ) මුදල් ණයට දීමේ ආඥාපනත ;

(ආ) ණය සහනදායක ආඥාපනත ; සහ

(ඇ) බඩු උකස්ගන්නන්ගේ ආඥාපනත.

**38.** (89 වන අධිකාරය වූ) උකස් පනතේ අර්ථානුකූලව බැංකුව අනුමත ණය දෙන නියෝජ්‍යායතනයක් වශයෙන් සලකනු ලැබිය යුතු ය. බැංකුව අනුමත ණය දෙන නියෝජ්‍යායතනයක් වශයෙන් සලකනු ලැබිය යුතු බව.

මුද්දර ගාස්තුවෙන් නිදහස් කිරීම.

**39**. 1982 අංක 43 දරන මුද්දර ගාස්තු පනතේ කුමක් සඳහන් වුව ද, බැංකුව විසින් සෑදිය යුතු යයි හෝ ලියා අත්සන් කරනු ලැබිය යුතු යයි නියමිත හෝ බලය දී ඇති යම් සාධන පත්‍රයක් හෝ බැංකුව විසින් බැංකුවේ ව්‍යාපාර කටයුතු සම්බන්ධයෙන් සාදන ලද හෝ ලියා අත්සන් කරන ලද යම් සාධන පත්‍රයක් සහ ණයක් සඳහා වන යම් ඇපයක් සම්බන්ධයෙන් බැංකුවට පක්ෂව වෙනත් යම් තැනැත්තකු විසින් සාදන ලද හෝ ලියා අත්සන් කරන ලද යම් සාධන පත්‍රයක් ඒ පනත යටතේ ගාස්තු ගෙවීමෙන් නිදහස් කරනු ලැබිය යුතු ය.

අධ්‍යක්ෂවරයන් යනාදීන්ගේ හානි පූරණය.

**40**. බැංකුවේ සෑම අධ්‍යක්ෂවරයකු, නිලධරයකු හෝ වෙනත් සේවා නියුක්තයකු ඕනෑකමින්ම කරන ලද ක්‍රියාවකින් හෝ පැහැර හැරීමකින් හැර, ඔහුගේ කාර්ය ඉටු කිරීමේ දී හෝ ඉටු කිරීම සම්බන්ධයෙන් හෝ ඔහු විසින් දරන ලද සියලු අලාභ හානි සහ වියදම් බැංකුව විසින් හානි පූරණය කරනු ලැබිය යුතු ය.

රහස්‍යතාව ප්‍රකාශ කිරීම.

**41**. (1) බැංකුවේ සෑම අධ්‍යක්ෂවරයෙක්, විගණකවරයෙක්, නිලධරයෙක්, සේවකයෙක්, අනුයෝජිතයෙක් හෝ බැංකුවේ ව්‍යාපාරික කටයුතුවල නිරතවී ඇති වෙනත් සෑම තැනැත්තෙක් විසින් ස්වකීය කාර්ය ආරම්භ කිරීමට පෙර, බැංකුවේ සියලු ගනුදෙනු, එහි ගනුදෙනුකරුවන්, යම් තැනැත්තකු හෝ ආයතනයක් සමග ඇති ගිණුම් පිළිබඳ තත්ත්වය සහ ඒවාට අදාළ සියලු කරුණු සම්බන්ධයෙන් දැඩි රහස්‍යතාව රකින බවට ප්‍රතිඥා දෙන ප්‍රකාශයක් අත්සන් කරනු ලැබිය යුතු අතර ස්වකීය කාර්ය ඉටු කිරීමේ දී තමාට දැනගන්නට ලැබෙන වෙනත් යම් කරුණු —

(අ) ඒවා එළිදරව් කරන ලෙස —

(i) මණ්ඩලය විසින්;

(ii) අධිකරණයක් විසින්;

(iii) ඒ කරුණු අදාළවන තැනැත්තා විසින්; හෝ

(iv) මුදල් මණ්ඩලය විසින්; හෝ

නියම කරනු ලබන විටක;

(ආ) ස්වකීය කාර්ය ඉටු කිරීමේ දී; හෝ

(ඇ) මේ පනතේ හෝ වෙනත් යම් නීතියක විධිවිධාන අතුරෙන් කිසිවක් අනුව ක්‍රියා කිරීම පිණිස

හැර එළිදරව් නොකිරීමට ඒ ප්‍රකාශයෙන් ඔහු විසින් ප්‍රතිඥා දිය යුතු ය.

(2) බැංකුවේ සෑම අධ්‍යක්ෂවරයකු, විගණකවරයකු, නිලධරයකු, සේවකයකු, අනුයෝජිතයකු හෝ බැංකුවේ ව්‍යාපාර කටයුතුවල නිරත වී සිටින වෙනත් සෑම තැනැත්තකු විසින් ම, බැංකුවේ ව්‍යාපාර කටයුතු සම්බන්ධයෙන් වූ යම් ප්‍රශ්නයකට පිළිතුරු දීම, (1) වන උපවගන්තිය යටතේ වූ තම රහස්‍යතා ප්‍රතිඥාව කඩනොකර කළ නොහැකි නම්, එසේ පිළිතුරු දීම ප්‍රතික්ෂේප කරනු ලැබිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ තමා විසින් අත්සන් කරන ලද ප්‍රකාශයක් කඩකරමින් යම් තොරතුරක් එළිදරව් කරන බැංකුවේ සෑම අධ්‍යක්ෂවරයකු, විගණකවරයකු, නිලධරයකු හෝ සේවකයකු, අනුයෝජිතයකු හෝ බැංකුවේ ව්‍යාපාර කටයුතුවල නිරත වී ඇති වෙනත් තැනැත්තකු මේ පනත යටතේ වරදකට වරදකරු වන අතර, මහෙස්ත්‍රාත්වරයකු ඉදිරියේ පැවැත්වෙන ලඝු නඩු විභාගයකින් පසු වරදකරු කරනු ලැබූ විට, රුපියල් දෙදහස් පන්සියයක් නොඉක්මවන දඩයකට, ඒ දඩය මහෙස්ත්‍රාත්වරයකු විසින් ස්වකීය සාමාන්‍ය අධිකරණ බලය ක්‍රියාත්මක කිරීමේ දී නියම කළ හැකි දඩ ප්‍රමාණය ඉක්මවන්නේ වුව ද, ඔහු යටත් විය යුතු ය.

**42.** මේ පනත යටතේ රීති සෑදීමට නියමිත හෝ බලය දී ඇති සියලු කාරණා හෝ මේ පනත යටතේ බැංකුවේ බලතල හා කාර්ය ඵලදායී ලෙස කරගෙන යාමට හා ඉටු කිරීමට බැංකුවට හැකිවන පරිදි අවශ්‍ය වෙනත් යම් කාරණයක් හෝ සම්බන්ධයෙන්, මණ්ඩලය විසින් රීති සාදනු ලැබිය හැකි ය. රීති.

**43.** බැංකුව — බැංකුව "ණය දෙන ආයතනයක්" "බැංකුවක්" සහ "බලපත්‍රලාභී විශේෂිත බැංකුවක්" විය යුතු බව.

(අ) 1990 අංක 2 දරන ණය ආපසු අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ සහ 1990 අංක 18 දරන ශ්‍රී ලංකා ණය තොරතුරු කාර්යාංශය පනතේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා "ණය දෙන ආයතනයක්" විය යුතු ය;

(ආ) 1990 අංක 4 දරන බැංකු මගින් ප්‍රදානය කරන ලද ණය අයකර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනතේ අර්ථානුකූලව සහ එහි කාර්යය සඳහා "බැංකුවක්" විය යුතු ය;

(ඇ) 1988 අංක 30 දරන බැංකු පනතේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා "බලපත්‍රලාභී විශේෂිත බැංකුවක්" විය යුතු අතර, සංස්ථාගත කිරීමේ නියමයේ සඳහන් ස්ථානයේ ව්‍යාපාරික කටයුතු කරගෙන යාම සඳහා ඒ

පනතේ විධිවිධානවලට අනුකූලව බලපත්‍රයක් නිකුත් කරනු ලැබිය යුතු ය ; තව ද, බලපත්‍රලාභී විශේෂිත බැංකු සම්බන්ධයෙන් ඒ පනත යටතේ මුදල් මණ්ඩලය විසින් නිකුත් කරනු ලැබිය හැකි සියලු විධානවලට එය යටත් විය යුතු ය;

(ඇ) (89 වන අධිකාරය වූ) උකස් පනතේ 47අ වගන්තියේ අර්ථානුකූලව "ණය දෙන ආයතනයක්" විය යුතු ය ; සහ

(ඉ) 1990 අංක 14 දරන දේශීය භාර ලදුපත් පනතේ අර්ථානුකූලව සහ එහි කාර්ය සඳහා වූ "අනුමත ණය නියෝජිත ආයතනයක්" විය යුතු ය.

ඉල්ලුම් තැන්පතු ඉතිරිකිරීමේ හෝ කාලසීමා තැන්පතු බවට පරිවර්තනය කිරීම.

**44.** (1) මේ පනතේ 2 වන වගන්තිය යටතේ යම් නිශ්චිත ප්‍රදේශයක් සඳහා බැංකුවක් පිහිටුවීම සමගම, බැංකුව පිහිටුවනු ලබන්නේ යම් නිශ්චිත ප්‍රදේශයක් ඇතුළත ද ඒ නිශ්චිත ප්‍රදේශය ඇතුළත කටයුතු කරගෙන යන්නා වූ යම් ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුවක් හෝ ඒ සියලු බැංකු විසින්, 45 වන වගන්තියේ සඳහන් නියමය පළකිරීමට පෙරාතුව, අවස්ථාවෝචිත පරිදි ඒ ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුවේ හෝ බැංකුවල ඉල්ලුම් තැන්පතු දරන තැන්පතුකරුවන්ගෙන්, ඒ තැන්පතුකරුවන් ඒ ඉල්ලුම් තැන්පතු ඉතිරි කිරීමේ හෝ කාලසීමා තැන්පතු බවට පරිවර්තනය කිරීමට කැමතිවන්නේ දැයි, ඒ සඳහා යවනු ලබන ලියාපදිංචි ලිපියක් මගින් ඒ ලිපියේ සඳහන් කාලය ඇතුළත බැංකුව හෝ බැංකු වෙත දන්වන ලෙස ඉල්ලා සිටිනු ලැබිය යුතු ය.

(2) ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුව හෝ බැංකු විසින් —

(අ) ලිපියේ සඳහන් කාලය ඇතුළත, ඒ ඉල්ලුම් තැන්පතුව ඉතිරි කිරීමේ හෝ කාලසීමා තැන්පතුවක් බවට පරිවර්තනය කිරීමට තැන්පත්කරු කැමැත්තක් දක්වන්නා වූ හෝ තම කැමැත්ත ප්‍රකාශ කිරීමට අපොහොසත් වන්නා වූ හෝ අවස්ථාවක ඒ ඉල්ලුම් තැන්පතුව ඉතිරි කිරීමේ හෝ කාලසීමා තැන්පතුවක් බවට පරිවර්තනය කළ යුතු ය; නැතහොත්

(ආ) ලිපියේ සඳහන් කාලසීමාව ඇතුළත පරිවර්තනය කිරීමට තැන්පතුකරු සිය විරෝධතාව ප්‍රකාශ කරන්නා වූ අවස්ථාවක, ඒ ඉල්ලුම් තැන්පතුවේ බැරට ඇති මුදල් තැන්පතුකරු වෙත ආපසු ගෙවනු ලැබිය යුතු ය.

## VII වන කොටස

## ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුවල ව්‍යාපාරික කටයුතු පැවරීම

ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුවල ව්‍යාපාරික කටයුතු බැංකුවකට පැවරීම.

**45.** (1) මේ පනතේ 2 වන වගන්තිය යටතේ සංස්ථාගත කිරීමේ නියමයක් මගින් යම් නිශ්චිත ප්‍රදේශයක් සඳහා (මෙහි මින් මතු "අත්කර ගැනීමේ බැංකුව" යනුවෙන් සඳහන් කරනු ලබන) බැංකුවක් පිහිටුවනු ලැබූ විට, මුදල් මණ්ඩලය විසින්, වෙනත් යම් නීතියක විධිවිධානවල පටහැණිව කුමක් සඳහන් වුව ද,සාධාරණ කාලයක් ඇතුළත, එහෙත්, අත්කර ගැනීමේ බැංකුව විසින් ව්‍යාපාර කටයුතු ආරම්භ කිරීමට පෙර, (මෙහි මින් මතු "පැවරීමේ නියමය" යනුවෙන් සඳහන් කරනු ලබන) ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින්, ( මේ පනතේ " පැවරීමේ බැංකුව හෝ බැංකු " යනුවෙන් සඳහන් කරනු ලබන ) යම් හෝ සියලු ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුවක් හෝ බැංකු විසින් කරගෙන යනු ලබන 1985 අංක 15 දරන ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු පනත යටතේ ඒ බැංකුවට හෝ බැංකුවලට කරගෙන යාමට බලය දී ඇත්තා වූ ද ඒ අත්කර ගැනීමේ බැංකුව පිහිටුවන ලද්දේ යම් නිශ්චිත ප්‍රදේශයක් සඳහා ද ඒ ප්‍රදේශය ඇතුළත ක්‍රියාත්මක වන්නා වූ ද, ව්‍යාපාර කටයුතු, අත්කර ගැනීමේ බැංකුව වෙත පවරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තියේ කාර්යය සඳහා"යම් පැවරීමේ බැංකුවක් හෝ සියලු පැවරීමේ බැංකු විසින් කරගෙන යනු ලබන ව්‍යාපාර කටයුතු" යන්නට—

(අ) පැවරීමේ නියමයේ දිනයට පෙරාතුවම වූ දිනයේ දී පැවරීමේ බැංකුවට හෝ බැංකුවලට අයත් වූ (මුදල් ශේෂ, සංචිත අරමුදල්, ආයෝජන හා තැන්පතු ඇතුළු) සියලු නිශ්චල හා චංචල දේපළ;

(ආ) පැවරීමේ නියමයේ දිනයට පෙරාතුවම වූ දිනයේ පැවරීමේ බැංකුවට හෝ බැංකුවලට අයත් වූ යම් චංචල හෝ නිශ්චල දේපළක හෝ දේපළකින් උද්ගතවන සියලු අයිතිවාසිකම්, බලතල, වරප්‍රසාද, අධිකාර හා සම්බන්ධකම් සහ ඒ පැවරීමේ බැංකුව හෝ බැංකු විසින් භුක්ති විඳිනු ලැබූ යම් නිශ්චල දේපළක බදු අයිතිවාසිකම්;

(ඇ) පැවරීමේ නියමයේ දිනයට පෙරාතුවම වූ දිනයේ පැවති පැවරීමේ බැංකුවේ හෝ බැංකුවල සියලු බැරකම්; සහ

(ඈ) ඒ පැවරීමේ බැංකුවේ හෝ බැංකුවල ව්‍යාපාරික කටයුතුවලට අදාළ හෝ සම්බන්ධ සියලු පොත්, ගිණුම් හා ලේඛන

ඇතුළත් වේ.

පැවරීමේ නියමයක බලපෑම.

46. අවස්ථාවෝචිත පරිදි, යම් පැවරීමේ බැංකුවක හෝ සියලු පැවරීමේ බැංකුවල ව්‍යාපාරික කටයුතු අත්කර ගැනීමේ බැංකුව වෙත පැවරීමේ දින සිට ක්‍රියාත්මක වන පරිදි —

(අ) පැවරීමේ බැංකුවේ හෝ බැංකුවලින් පැවරුණු ව්‍යාපාරික කටයුතුවල පාලනය හා සන්තකය අත්කර ගැනීමේ බැංකුවට තිබිය යුතු අතර, ඒ පැවරීමේ බැංකුවේ හෝ බැංකු සතු ව්‍යාපාරික කටයුතුවල පැවරුම් ලාභියා වන්නේ ය; තවද,

(ආ) ඒ පැවරීමේ බැංකුව හෝ බැංකු පිහිටුවන ලද්දේ වූ 1985 අංක 15 දරන ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු පනත යටතේ සාදන ලද, අවස්ථාවෝචිත පරිදි, සංස්ථාගත කිරීමේ නියමය හෝ නියමයන් ප්‍රත්‍යාදිෂ්ට කරනු ලැබූ ලෙස සැලකිය යුතු ය.

ගිණුම් විගණනය සහ පැවරූ ව්‍යාපාරික කටයුතු අගැයීම.

47. (1) පැවරීමේ දිනට පෙරාතුවම වූ දිනයේ යම් පැවරීමේ බැංකුවක් හෝ බැංකුවල පැවති ව්‍යාපාරික කටයුතුවල ශුද්ධ වටිනාකම නිසැකව දැන ගැනීමේ කාර්යය සඳහා මුදල් මණ්ඩලය විසින්, සුදුසුකම් ලත් විගණකවරයකු මගින් ඒ පවරාදෙන ලද ව්‍යාපාරික කටයුතු පිළිබඳ විගණනයක් කරවීමට සලස්වනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ පත් කරන ලද විගණකවරයා විසින්, මුදල් මණ්ඩලය නිශ්චය කරන යම් කාල පරිච්ඡේදයක් ඇතුළත, ඒ මණ්ඩලය වෙත වාර්තාවක් ඉදිරිපත් කරනු ලැබිය යුතු අතර, මුදල් මණ්ඩලය විසින් වාර්තාව සලකා බලා, ඒ වාර්තාව පිළිගැනීමට පෙර අවශ්‍ය වේ නම්, අවශ්‍ය යයි මණ්ඩලය සලකන වැඩි දුර තොරතුරු හෝ පැහැදිලි කිරීම් සපයන ලෙස විගණකවරයාට නියම කරනු ලැබිය යුතු ය.

අතිරික්ත ශුද්ධ වටිනාකමට සරිලන සෘණ පත්‍ර මුදල් මණ්ඩලය වෙත නිකුත් කරනු ලැබිය යුතු බව.

48. (1) පැවරීමේ බැංකුවේ හෝ බැංකුවල ශුද්ධ වටිනාකම, 18 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (අ) ඡේදය යටතේ බැංකුවක ආරම්භක ප්‍රාග්ධනයට මහ බැංකුව විසින් දෙන ලද දායක මුදලට වඩා වැඩිවන අවස්ථාවක, පැවරීමේ බැංකුවේ හෝ බැංකුවල ශුද්ධ වටිනාකම, 47 වන වගන්තිය යටතේ මුදල් මණ්ඩලය විසින් පිළිගැනීමෙන් පසු සති දෙකක් ඇතුළත, ඒ බැංකුව විසින්, වර්ෂයකට සියයට දොළහක් බැගින් වූ පොළියක් උපයන සෘණ පත්‍ර ඒ අතිරික්තයේ වටිනාකමට මුදල් මණ්ඩලය වෙත නිකුත් කරනු ලැබිය යුතු ය.

(2) (1) වන උපවගන්තිය යටතේ මුදල් මණ්ඩලය වෙත නිකුත් කරන ලද ණය පත්‍ර වෙනත් යම් තැනැත්තකු වෙත පැවරීමට මුදල් මණ්ඩලයට හිමිකම ලැබෙන අතර, ඒ ණය පත්‍රයේ පැවරුම් ලාභියාට, ඒ ණය පත්‍ර සම්බන්ධයෙන් මුදල් මණ්ඩලයට මෙන්ම එම අයිතිවාසිකම් තිබිය යුතු ය.

(3) (1) වන උපවගන්තිය යටතේ නිකුත් කරන ලද ණය පත්‍ර කිසිවක් ඒ ණය පත්‍ර නිකුත් කරන ලද දින සිට අවුරුදු දහයක් ඉකුත්වීමේ දී බේරා ගැනීම, අත්කර ගැනීමේ බැංකුවේ කාර්යය වන්නේ ය.

(4) වටිනාකමින් (1) වන උපවගන්තිය යටතේ මුදල් මණ්ඩලය වෙත නිකුත් කරන ලද ණය පත්‍රවල හෝ ඉන් යම් කොටසක වටිනාකමට සරිලන කොටස් මහ බැංකුව විසින් එම මිලට අත්කරගනු ලැබිය හැකි අතර, එසේ කිරීමට මහ බැංකුව තීරණය කරන අවස්ථාවක, මණ්ඩලය විසින්, මහ බැංකුව වෙත බැංකුවේ කොටස්, ඒ වටිනාකමේ ප්‍රමාණයට වෙන්කර දෙනු ලැබිය යුතු ය.

**49**. පැවරීමේ දිනයේ සිට ක්‍රියාත්මක වන පරිදි— රැකදීමේ විධිවිධානය.

(අ) පැවරීමේ බැංකුවේ හෝ බැංකුවල පැවරුනු ව්‍යාපාරික කටයුතුවලට සම්බන්ධ හෝ අදාළ වන්නා වූ ද පැවරීමේ දිනට පෙරාතුවම වූ දිනයේ පැවතුනා වූ හෝ බලාත්මකව තිබුනා වූ ද, පැවරීමේ බැංකුව හෝ බැංකු පාර්ශවකරුවකු වන්නා වූ හෝ පැවරීමේ බැංකුවේ හෝ බැංකුවල වාසියට ඇත්තා වූ ද, සියලු ගිවිසුම්, ඔප්පු, බැඳුම්කර, එකඟවීම්, ඇටෝර්නි බලතල, නෛතික නියෝජන ප්‍රදාන සහ කවර වූ හෝ ස්වභාවයේ වෙනත් සාධන පත්‍ර, පැවරීමේ දිනයේ සිට ක්‍රියාත්මක වන පරිදි, අත්කර ගැනීමේ බැංකුව විසින්, අවස්ථාවෝචිත පරිදි, ඇතුළත් වූ හෝ දෙන ලද ගිවිසුම්, ඔප්පු, බැඳුම්කර, එකඟවීම්, ඇටෝර්නි බලතල, නෛතික නියෝජන ප්‍රදාන හෝ වෙනත් සාධන පත්‍ර වශයෙන් සලකනු ලැබිය යුතු ය ;

(ආ) පැවරීමේ බැංකුව හෝ බැංකු විසින් හෝ පැවරීමේ බැංකුව හෝ බැංකුවලට එරෙහිව හෝ පවරණ ලද්දා වූ ද ඒ බැංකුවේ හෝ බැංකුවල පැවරුණු ව්‍යාපාරික කටයුතුවලට සම්බන්ධ හෝ අදාළ වූ ද පැවරීමේ දිනට පෙරාතුවම වූ දිනයේ දී විනිශ්චයට භාජනව පැවති කවර වූ හෝ

ස්වභාවයක සියලු නඩු හා නීති කෘත්‍ය, පැවරීමේ දින සිට ක්‍රියාත්මක වන පරිදි අත්කර ගැනීමේ බැංකුව විසින් හෝ ඊට එරෙහිව පවරනු ලැබූ නඩු හෝ නීති කෘත්‍ය ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ අනුව ඒ පිළිබඳව දිගටම කටයුතු කරගෙන යා හැකි ය. නැතහොත්, නඩු පවරනු ලැබිය හැකි ය.;

(ඇ) පැවරීමේ දිනට පෙරාතුවම වූ දිනයේ පැවරීමේ බැංකුවේ හෝ බැංකුවල ස්ථිර තනතුරක් දරන්නා වූ ඒ පැවරීමේ බැංකුවේ හෝ බැංකුවල සියලු නිලධරයන් සහ සේවකයන් වෙත අත්කර ගැනීමේ බැංකුවේ සේවා නියුක්තිය අර්පණය කළ යුතු අතර —

(i) ඒ අර්පණය පිළිගනු ලබන අවස්ථාවක ඒ නිලධරයන් සහ සේවකයන් ඒ නිලධරයන් හා සේවකයන්ගේ සුදුසුකම් හා පළපුරුද්ද සැලකිල්ලට ගනිමින්, අත්කර ගැනීමේ බැංකුව සාධාරණ යයි සලකන සේවා නියුක්ති නියමයන් හා කොන්දේසි මත එහි සේවයේ නියුක්ත කරනු ලැබිය යුතු ය ; සහ

(ii) ඒ අර්පණය නොපිළිගත් අවස්ථාවක, ඒ නිලධරයන් සහ සේවකයන් 50 වන වගන්තිය යටතේ තීරණය කරනු ලබන පරිදි, වන්දි ගෙවීමට හිමිකම ලැබිය යුතු ය.

වන්දි ගෙවීම.

**50**. පැවරීමේ බැංකුවේ හෝ බැංකුවල යම් නිලධරයකු හෝ සේවකයකු වන්දි ගෙවීමකට හිමිකම් ලබන අවස්ථාවක, ගෙවිය යුතු වන්දි මුදල අත්කර ගැනීමේ බැංකුව විසින් කම්කරු කොමසාරිස්වරයා විමසා නිශ්චය කරනු ලැබිය යුතු අතර, ඒ නිශ්චය කිරීම නිසා වෙනත් යම් ලිඛිත නීතියක් යටතේ ඒ නිලධරයා හෝ සේවකයා සතු අයිතිවාසිකම් කෙරෙහි බලපෑමක් නොවන ලෙස සලකනු ලැබිය යුතුය .

අනනුකූලතාවක් ඇති වූ විට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

**51**. මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අර්ථ නිරූපණය

**52**. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ පනතෙහි —

"අනුග්‍රහය" යන්නෙන් යම් ණයක්, අයිරාවක්, අත්තිකාරමක් හෝ සම්භාව්‍ය වගකීමක් පිළිගැනීම පිණිස වූ බැඳීමක් ඇතුළු යම් ණයක්, අයිරාවක්, හෝ අත්තිකාරමක් ප්‍රදානය කිරීමට වූ යම් බැඳීමක් අදහස් වේ ;

"ලංකා බැංකුව" යන්නෙන්, (397 වන අධිකාරය වූ) ලංකා බැංකු ආඥාපනත මගින් පිහිටුවන ලද ලංකා බැංකුව අදහස් වේ ;

"බැංකු ආයතනය" යන්නෙන්, 1988 අංක 30 දරන බැංකු පනත යටතේ ලියාපදිංචි කරන ලද බැංකුවක් අදහස් වේ ;

"මහ බැංකුව" යන්නෙන්, (422 වන අධිකාරය වූ) මුදල් නීති පනත මගින් පිහිටුවන ලද ශ්‍රී ලංකා මහ බැංකුව අදහස් වේ ;

"සමුපකාර සමිතිය" යන්නෙන්, 1972 අංක 5 දරන සමුපකාර සමිති පනත යටතේ ලියාපදිංචි කරන ලද්දා වූ හෝ ලියාපදිංචි කරන ලදැයි සැලකෙන සමිතියක් අදහස් වේ;

"සේවක අර්ථසාධක අරමුදල" යන්නෙන්, 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල පනත යටතේ පිහිටුවන ලද සේවක අර්ථසාධක අරමුදල අදහස් වේ;

"ව්‍යවසාය" යන්නෙන්, කවර වූ හෝ නාමයකින් හෝ පදවි නාමයකින් හඳුන්වනු ලබන, සංස්ථාගත කළ හෝ සංස්ථාගත නොකළ පුද්ගල මණ්ඩලයක් අදහස් වන අතර, ඊට ඒක පුද්ගල සංස්ථාවක් හෝ තනි අයිතියක් ඇතුළත් වේ ;

"බලපත්‍රලාභී වාණිජ බැංකුව" යන්නෙන්, 1988 අංක 30 දරන බැංකු පනත යටතේ බලපත්‍රලාභී වාණිජ බැංකුවක් වශයෙන් බලපත්‍රයක් දෙන ලද හෝ බලපත්‍රයක් දෙන ලැදැයි සැලකෙන වාණිජ බැංකුවක් අදහස් වේ;

"බලපත්‍රලාභී විශේෂිත බැංකුව" යන්නෙන්, 1988 අංක 30 දරන බැංකු පනත යටතේ බලපත්‍ර ලාභී විශේෂිත බැංකුවක් වශයෙන් බලපත්‍රයක් දෙන ලද හෝ බලපත්‍රයක් දෙන ලදැයි සැලකෙන සමාගමක් හෝ ආයතනයක් අදහස් වේ;

"මුදල් මණ්ඩලය" යන්නෙන්, (422 වන අධිකාරය වූ) මුදල් නීති පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය අදහස් වේ;

"ජාතික ඉතිරි කිරීමේ බැංකුව" යන්නෙන්, 1971 අංක 30 දරන ජාතික ඉතිරි කිරීමේ බැංකු පනතින් පිහිටුවන ලද ජාතික ඉතිරි කිරීමේ බැංකුව අදහස් වේ;

"පැවරීමේ බැංකුවේ හෝ බැංකුවල ශුද්ධ වටිනාකම" යන්නෙන්, 45 වන වගන්තිය යටතේ නියමයන් ප්‍රකාර අත්කර ගැනීමේ බැංකුව වෙත පැවරුනු පැවරීමේ බැංකුවේ හෝ බැංකුවල බැරකම්වල වටිනාකම (47වන වගන්තිය යටතේ විගණකවරයා විසින් නිශ්චය කරනු ලබන ආපසු අයකර ගත නොහැකි වත්කම් හැර) ඒ නියමය ප්‍රකාර, අත්කර ගැනීමේ බැංකුව වෙත පැවරුනු, පැවරීමේ බැංකුවේ හෝ බැංකුවල වත්කම්වල වටිනාකම අදහස් වේ ;

"මහජන බැංකුව" යන්නෙන්, 1961 අංක 29 දරන මහජන බැංකු පනතින් පිහිටුවන ලද මහජන බැංකුව අදහස් වේ ;

"ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකුව හෝ බැංකු" යන්නෙන්, 1985 අංක 15 දරන ප්‍රාදේශීය ග්‍රාමීය සංවර්ධන බැංකු පනත යටතේ පිහිටුවන ලද බැංකුවක් හෝ බැංකු අදහස් වේ ;

" ප්‍රදේශය" යන්නෙන්, (392 වන අධිකාරය වූ) පරිපාලන දිස්ත්‍රික්ක පනතේ සඳහන් පරිපාලන දිස්ත්‍රික්ක එකක් හෝ වැඩි ගණනක් අදහස් වේ;

"සුළු පරිමාණය" යන්න ග්‍රාමීය සංවර්ධන ව්‍යාපෘතියක් සම්බන්ධයෙන් යෙදෙන විට, රුපියල් හතළිස් ලක්ෂයකට අඩු ස්ථාවර වත්කම්වලින් යුත් වටිනාකමක ව්‍යාපෘතියක් බව ඉන් අදහස් වේ; සහ

"පැවරුනු ව්‍යාපාර කටයුතු" යන්න පැවරීමේ බැංකු හෝ බැංකු සම්බන්ධයෙන් යෙදෙන විට ඒ බැංකුව හෝ බැංකු සතු වූ, 45 වන වගන්තිය යටතේ වූ නියමයකින් අත්කර ගැනීමේ බැංකුව වෙත පවරනු ලැබූ, ව්‍යාපාර කටයුතු අදහස් වේ.

පාර්ලිමේන්තුවේ සියලු පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිල (දේශීය) රු. 870 යි. (විදේශීය) රු. 1,160 යි. අංක 32, ට්‍රාන්ස්වර්ක්ස් මන්දිරය, ලෝවර් පාර, කොළඹ 01, රජයේ ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරී වෙත සෑම වර්ෂයක ම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.